ලංකාදීප
මැදරට
2021 නොවැම්බර් මස 14 වැනිදා ඉරිදා

මධ්‍යම පළාතේ ප්‍රා.ලේ. කොට්ඨාස 27ක නාය යාමේ අවදානම්

ජල ගැලීමෙන් හා නාය යාමෙන් 306 ක් විපතේ

සති දෙකකදී අකුරණ නගරය හය වරක් යටවෙලා

(පේරාදෙණිය - අරවින්ද නාගහඇල්ල)

අධික වැසි සහිත තත්ත්වයත් සමඟ මධ්‍යම පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 27කට ජාතික ගොඩනැගිලි පරේක්ෂණ සංවිධානය මගින් නාය යෑමේ අනතුරු ඇඟවීම් කර තිබේ.

එම සංවිධානය මගින් පසුගිය 10 වැනිද නිකුත් කළ වාර්තාවට අනුව මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18කටත්, මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05කටත්, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04කටත් මෙම දැනුම් දීම කර ඇත.

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර, මිණිපේ, මැද මහනුවර, පූජාපිටිය, දෙල්තොට, හතරලියද්ද, අකුරණ, පන්විල, කුණ්ඩසාලේ, හාරිස්පත්තුව, දෙළුව, යටිනුවර, උඩ පළාත, පස්භාගේ කෝරළේ, ගඟවට කෝරළේ, උඩුනුවර, ගඟ ඉහළ කෝරළේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ද මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේපොළ, මාතලේ, යටවත්ත, උකුවෙල, රත්තොට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ද නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ, වලපනේ, හඟුරන්කෙත, අඹගමුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ද අදළ දැනුම් දීම කර තිබෙන බව ජාතික ගොඩනැගිලි පරේක්ෂණ සංවිධානය පවසයි.

වර්ෂාව හේතුවෙන් ඇතිවූ ජල ගැලීම් හා නාය යෑම් හේතුවෙන් මධ්‍යම පළාතේ පවුල් 88කට අයත් පුද්ගලයින් 306 දෙනෙක් බලපෑමට ලක්ව සිටින බව ජාතික ආපද කළමනාකරණ මධ්‍යස්ථානය නිකුත් කළ වාර්තාවේ සඳහන් වෙයි.

මහනුවර දිස්ත්‍රික්කයේ පවුල් 38 කට අයත් සාමාජිකයන් 169 දෙනකුත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ පවුල් 39 කට අයත් සාමාජිකයින් 94 දෙනකුත් මාතලේ දිස්ත්‍රික්කයේ පවුල් 11 කට අයත් පුද්ගලයින් 43 දෙනකුත් බලපෑමට ලක්ව සිටිති.

අකුරණ යටවෙන්නේ පිඟාඩයේ අනවසර ඉදිකිරීම් නිසයි

භූ විද්‍යා මහාචාර්ය අතුල සේනාරත්න

අකුරණ නගරය පසුගිය දෙසතියක කාලයේදී හය වතාවක් ජලයෙන් යටවීම නිසා මහනුවර - යාපනය ඒ-09 මාර්ගයේ ගමනාගමන කටයුතුවලට දැඩි බාධා එල්ල විය.

සුළු වර්ෂාවකදී පවා අකුරණ නගරය ජලයෙන් යටවන්නේ පිඟාඩය හරස් කර ඉදිකර තිබෙන අනවසර ඉදි කිරීම් නිසා ජලය නිසි ලෙස බැස යාමට නොහැකි වීමෙන් බව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යා අංශයේ මහාචාර්ය අතුල සේනාරත්න මහතා පවසයි.

කාබනික පොහොර ගැන දිසා ලේකම් කියන්නේ බොරු

ලන්නැහේ කොරහේ කිඹුල්ලු දකිනවා

මිනිපේ වම් ඉවුර ගොවි පදනමේ ලේකම් වීරකෝන් බණ්ඩාරගෙන් චෝදනා

දිස්ත්‍රික්කයට වුවමනා පොහොර දැනටත් නිෂ්පාදනය කරලා

මහනුවර දිසා ලේකම් චන්දනගෙන් පිළිතුරු

(සෙංකඩගල - ඉඳුනිල් කහටපිටිය)

මහනුවර දිස්ත්‍රික්කයේ කාබනික පොහොර අවශ්‍යතාව සපුරා ඇති බවට දිස්ත්‍රික් ලේකම්වරයා කරන ප්‍රකාශය අසත්‍යයක් බවට සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ මිනිපේ වම් ඉවුර ගොවි පදනමේ ලේකම් වීරකෝන් බණ්ඩාර මහතා චෝදනා කරයි.

කාබනික පොහොර මෙට්‍රික් ටොන් 10,676ක අවශ්‍යතාවක් මහනුවරට තිබෙන නමුත් මේ වනවිට පොහොර ටොන් 23,332 ක් පමණ නිෂ්පාදනය කර ඇතැයි දිස්ත්‍රික් ලේකම් ප්‍රකාශ කරන්නේ නිවැරදි සංඛ්‍යාලේඛන ලබා ගැනීමකින් තොරව බවට ද ගොවි නායකයා හෙළි කරයි.

මේ සම්බන්ධයෙන් ගොවි පදනමේ ලේකම්වරයා මෙසේද පැවසුවේය.

"දිසාපතිවරයා මේ ප්‍රකාශය කරන්නේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා දිරි දීමනා ලබා දුන් වාර්තා උපයෝගි කර ගෙනයි. කෙටියෙන්ම කියනවා නම් ඒ ප්‍රදේශවල ගොවීන්ට දීමනාව ලබාදීම සඳහා භාවිත කළ නම් ලැයිස්තුව යොදා ගෙනයි. මේක සම්පූර්ණයෙන්ම වැරැදියි.

මේ වනවිට දීමනා මුදල බෙදමින් පවතිනවා. දීමනාව ලබාදීම සඳහා ගොවීන්ගෙන් ලබා ගන්නා අයදුම් පත්‍රයට වගාව සඳහා කාබනික පොහොර අප විසින්ම නිෂ්පාදනය කර ගන්නවා කියලා අත්සනක් ලබා ගන්නවා. මේ සියල්ල මගින් කරලා තියෙන්නේ ගොවියා අසරණ කිරීමක්. ඔය කියන කාබනික පොහොර මේ වන විටත් ක්ෂේත්‍රයේ තැනින් තැන ජීරණය වෙමින් පවතින්නේ. ඒවා වගාවට යොදන්න තරම් සුදුසු ලෙස සකස් වෙලා නැහැ. සමහර ඒවා දිරලා නැහැ. දූපු විදිහටම තියෙනවා. මේවගේ ප්‍රමිතිය ගැන කිසිම කෙනෙක් සහතිකයක් දීලා නැහැ.

සමහර ගොවියෝ මේ කාබනික පොහොර නිෂ්පාදනය කරන්නේ කොහොමද කියලා දන්නේ නැහැ. කවුද උපදෙස් දුන්නේ. හිතුමනාපෙට ගොවීන් පොහොර හැදුවා. උෂ්ණත්වය මොන මට්ටමකට තියෙන්න ඕනෙද කියලා කවුරුවත් දන්නේ නැහැ. ඇත්තටම කියන්න තියෙන්නේ දිසාපතිවරයා කොරහේ කිඹුල්ලු දකිනවා කියලා තමයි."

මහනුවර දිස්ත්‍රික් ලේකම් චන්දන තෙන්නකෝන් මහතා මෙම චෝදනාවට මෙසේ පිළිතුරු දෙයි.

"මේ වනවිට අපි කාබනික පොහොර මෙට්‍රික් ටොන් 12000 ක් පමණ හදලා ඉවරයි. ගොවීන්ට පොහොර අවශ්‍ය නම් අපෙන් ඉල්ලන්න, ඒ ඉල්ලන ප්‍රමාණය දෙන්න අපි සූදනම්. ගොවීන් විතරක් නෙවෙයි රජයේ ආයතන සහ පෞද්ගලික ආයතනත් පොහොර හදනවා. නුවර නගර සභාවේ ටොන් 100 ක් තිබෙනවා. කුණ්ඩසාලේ ටොන් 300 ක් තිබෙනවා. ගොවිජන සේවා මධ්‍යස්ථානවල මේ වනකොට ටොන් 900 ක් හදලා ඉවරයි. පෞද්ගලික අංශ සතුව ටොන් 2000 කට වඩා තිබෙනවා. ගොවීන්ට ආධාර දීලා හදපුවා දැනට තියෙනවා ටොන් පන්දහස් ගණනක්. අපි ගොවීන් 27,000 කට විතර පොහොර හදන්න දීලා තියෙනවා. මොරයාය, උල්පතගම ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ටොන් 30 බැගින් කාබනික පොහොර තිබෙනවා. ගොවීන්ට අපි කියන්නේ අවශ්‍ය පොහොර ඉල්ලන්න කියලයි. සැලැස්මක් අනුව මේක යන්නේ. මිණිපේ ව්‍යාපාරයට කාබනික පොහොර ටොන් 2000 ක් විතර තමයි ඕන වෙන්නේ. ගොවීන්ට හදන්න කියපු පොහොර සමහර තැන්වල හරියට සකස් වෙලා නැහැ. මම කිව්වේ ඒවා ගැන නොවෙයි. මහනුවර දිස්ත්‍රික්කයට අවශ්‍ය කාබනික පොහොර ප්‍රමාණය අපි මේ වනවිට නිෂ්පාදනය කර තිබෙනවා." යි දිසා ලේකම් යළිත් කියයි.

රත්තොට හා උකුවෙල තැන් 106ක පස් කඳු කඩා වැටිලා-ගල් පෙරළිලා

(මාතරල් ඇම්.ඩබ්. සෝමරත්න)

දින කිහිපයක් තිස්සේ ඇඳ හැළෙන මහ වැසි හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට සහ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකෙහි ස්ථාන106ක පස්කඳු කඩා වැටීම් හා ගල් පෙරළීම් සිදුවී නිවාස 40කට අර්ධ හානි සිදුවී තිබෙන බව ජාතික ගොඩනැගිලි පරේක්ෂණ ආයතනයේ මාතලේ ප්‍රධානී භූ විද්‍යාඥ එම්.ඩබ්. එන්.සී.යූ.බී. මොරේමඩ මහතා පවසයි.

අධි අවදානම් ස්ථාන කිහිපයක පවුල් 29ක් ඒ ස්ථානවලින් වහාම ඉවත් කිරීමට ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දැනුම් දී ඇති බව ද ඒ මහතා පැවසීය. අයහපත් කාලගුණය හේතුවෙන් මෙම දිස්ත්‍රික්කයේ රත්තොට හා උකුවෙල කලාපවලට නිකුත් කර ඇති අවදානම් තත්වය තවදුරටත් පවත්වාගෙන යාමට ප්‍රකාශ නිකුත් කර ඇති බව ඒ මහතා පැවසීය.

භූ විද්‍යාඥ මොරේමඩ

වැසි තත්ත්වය තවදුරටත් පැවතුණහොත් මීට පෙර වර්ෂවල නාය ගිය ස්ථානවල පදිංචිකරුවන්ට නිවෙසේම සිටින ලෙස දැනුම් දී ඇති බව ද මොරේමඩ මහතා පැවසීය.

වැස්සත් සමග ඩෙංගුත් පැතිරෙයි

මාස 10කදී මධ්‍යම පළාතෙන් රෝගීන් 892ක්

(හාරිස්පත්තුව මොහොමඩ් ආසික්)

මහනුවර, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කවලින් මේ වසරේ ගෙවී ගිය මාස දහයේදී ඩෙංගු රෝගීන් 892ක් වාර්තා වී ඇති බව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වසංගත රෝග විද්‍යා අංශය කියයි.

මහනුවර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 659ක්ද, මාතලේ දිස්ත්‍රික්කයෙන් රෝගීන් 189ක්ද, නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් රෝගීන් 42ක්ද වාර්තා වී ඇති බව සෞඛ්‍ය අංශ කියයි.

2020 මුල් මාස දහයට සාපේක්ෂව මේ වසරේ මුල් මාස දහය තුළ වාර්තා වී ඇති ඩෙංගු රෝගීන්ගේ සංඛ්‍යාවේ අඩුවක් පෙන්නුම් කළ ද, පවතින වැසි සහිත කාලගුණ තත්ත්වයත් සමග ඩෙංගු රෝගය පැතිරීමේ අවදානමක් පවතින බව ද සෞඛ්‍ය අංශ පෙන්වා දෙයි.

2020 මුල් මාස දහයේ දී මහනුවර දිස්ත්‍රික්කයෙන් ඩෙංගු රෝගීන් 3,274ක්ද, මාතලේ දිස්ත්‍රික්කයෙන් ඩෙංගු රෝගීන් 56ක් සහ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් 67ක් වශයෙන් මධ්‍යම පළාතෙන් ඩෙංගු රෝගීන් 4007ක් වාර්තා වී තිබිණි.

පවතින වැසි සහිත කාලගුණ තත්ත්වයත් සමග මධ්‍යම පළාත තුළල්ලා සිටියි.

රාගල පැරැණි බස් පොළේ දේශපාලන හෙංචයියන් අනවසරෙන් කඩ හදලා

(නුවරඑළිය සම්පත් ජයලාල්)

රාගල පැරැණි බස් නැවතුම්පොළ ප්‍රදේශයේ දේශපාලනඥයකුගේ ආධාරකරුවන් පිරිසක් බලහත්කාරයෙන් අත්පත්ක කරගෙන, එහි අනවසරයෙන් කඩ කාමර 10ක් ඉදිකර ඇති බව වාර්තා වෙයි.

මධ්‍යම පළාතේ ඇති සියලුම බස් නැවතුම්පොළවල් හා ඒවායේ පිහිටි ගොඩනැගිලි මධ්‍යම පළාත් ප්‍රවාහන අධිකාරිය සතු වන අතර, 2001 ජනවාරි 29 වැනි දිනැති අංක 1109 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් එයට අදළ බස් නැවතුම් පොළවල් 51ක් ප්‍රකාශයට පත් කර තිබේ. එහි අනු අංක 44 යටතේ ප්‍රසිද්ධියට පත්කොට ඇති මෙම පැරැණි බස් නැවතුම් පොළ බලහත්කාරී ලෙස අත්පත් කර ගැනීම රාජ්‍ය දේපළ අවභාවිත කිරීමකි.

ඒ සම්බන්ධයෙන් ලද පැමිණිලි අනුව මධ්‍යම පළාත් පාලන කොමසාරිස්වරයාගේ නියෝගය පරිදි නුවරඑළිය සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා එහි ස්ථානීය පරීක්ෂාවක් සිදුකොට තිබේ.

ඒ වාර්තාවට අනුව පැරැණි බස් නැවතුම්පොළෙහි අයිතිය කා සතුද යන්න තහවුරුව නැති බව පෙන්වා දෙයි. එසේම එහි සිදුවන ඉදිකිරීම් සඳහා ප්‍රාදේශී සභාවේ නිසි අනුමැතියක් ලබාගෙන නොමැති බැවින්, වලපනේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට පැවරී ඇති බලතල අනුව එය නතර කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටියි.

එහි අයිතිය තහවුරු කර ගැනීම සුදුසු බවත්, ඒ ඉඩම් කොටස ප්‍රාදේශීය සභාවට පවරාගෙන විධිමත් සැලැස්මකට අනුව සංවර්ධනය කිරීම සුදුසු බවටත්, නුවරඑළිය සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා තම වාර්තාව මගින් නිර්දේශ කොට තිබේ.

මහනුවර මහ නගර සභාවේ සුළු සේවකයන්ගේ අතිකාල කපලා ඉහළ නිලධාරීන් සියලු දීමනා අරන්

විපක්ෂ නායක සේන දිසානායකගෙන් චෝදනා

(සෙංකඩගල ඉඳුනිල් කහටපිටිය)

මහනුවර මහ නගර සභාවේ සාමාන්‍ය සේවකයන්ගේ අතිකාල කපා දමා ඉහළ නිලධාරීන් රිසි සේ අතිකාල හා නිවාඩු දීමනා ලබා ගන්නා බවට විපක්ෂ නායක සේන දිසානායක මහතා චෝදනා කරයි.

සාමාන්‍ය සේවකයන් තළා පෙළා මේ ආකාරයට නිලධාරීන්ට අවශ්‍ය ලෙස නගර සභාව මෙහෙය වීමට ඉඩදිය නොහැකි බව ද ඒ මහතා පවසයි.

මහනුවර මහ නගර සභාවේ මහ සභා රැස්වීම පසුගියද පැවැති අවස්ථාවේ මේ බව අනාවරණය කළ සේන දිසානායක මහතා මෙසේ ද කීය. කොරෝනා දීමනාව නගර සභාවේ කට්ටියක් ලබා ගෙන තිබුණත් තවත් කට්ටියකට ඒක ලබාදී නැහැ. මේක ගෙවලා තියෙන විදිහ හරි අපූරුයි. කොරෝනා හැදිලා මැරුණ විශාල පිරිසකගේ අවසන් කටයුතු කළේ නගර සභාවට අයිති මහයියාව ආදහනාගාරයේ දී. පවුලේ සාමාජිකයන් දෙතුන් දෙනෙකුට විතරයි ඒ අවස්ථාවට සහභාගි වෙන්න සෞඛ්‍ය අංශ අවසර දීලා තිබුණේ. කවුරුවත් මළ සිරුර ළඟට කිට්ටු වෙන්නේ නැහැ.

ආදහනාගාරයේ ඉන්න අපේ නගර සභාවේ සේකවකයන් තමයි පෙට්ටිය කර ගහගෙන ගිහින් ආදහනාගාරයට ඇතුළු කරන්නේ. එක දවසකට මේ අය මිනී 20 ක් පුච්චපු අවස්ථා තිබුණා. මේ අයටත් දරු පවුල් ඉන්නවා. මිනියක් පුච්චලා ඉවර වුණාම එතන දීම නාලා තමන්ගේ වියදමින් ත්‍රීවීල් එකක් අරන් මේ අය ගෙවල්වලට ගියේ. කොරෝනා සහන දීමනාව මාසයකට රුපියල් 7,500 ක් ගෙව්වා. මාස තුනට රුපියල් 22,500 ක් නගර සභාවේ සමහරු ගත්තා. මිනිය උස්සන් ගිහින් ආදහනාගාරයට දපු නගර සභාවේ සේවකයාට ඒ දීමනාව නැහැ. සුසාන භූමි පාලකවරයාට, කම්කරුවට නොගෙව්වට සභාවේ ඉන්න නිලධාරීන් මේක ගත්තා. මේවා සදාචාරයක් තියෙන වැඩ ද?

ආණ්ඩුකාරවරයා පරීක්ෂණයක් කරනවා ඒ නිසා මං ඒ ගැන කතා කිරීම සුදුසු නෑ

නාගරික කොමසාරිස් අමිලගෙන් පිළිතුරු

සභා අනුමැතියක් නැතුව මේ ගෙවීම් කරන්න කවුද අනුමැතිය දුන්නේ. මේ නිසා අපි මුදල් කාරක සභා වාර්තාව අනුමත කරන්නේ නැහැ. කාට ද ගෙව්වේ කියලා නම් ගම් සහිතව අපි දැන ගන්න ඕන. මහනුවර මහ නගර සභාව කියන්නේ ගමේ මරණාධාර සමිතියක් නෙවෙයි. සමහර නිලධාරීන් හිතාගෙන ඉන්නේ මන්ත්‍රීවරුන් හරක් කියලයි.

මේ සම්බන්ධයෙන් මහනුවර නාගරික කොමසාරිස් අමිල නවරත්න මහතාගෙන් කළ විමසීමක දී ඔහු මෙසේ කීවේය.

මේ සම්බන්ධව දැන් මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා පරීක්ෂණයක් කරනවා. ඒ නිසා මම මේ ගැන යමක් ප්‍රකාශ කිරීම සුදුසු නැහැයි හෙතෙම කීය.

ජනතා පීඩනය පුපුරණවා අපට පාරේ බැහැලා යන්න බෑ

රට පුරා උද්ඝෝෂණය කරන්නේ පොහොට්ටුව බලයට ගෙනා අයයි

ආණ්ඩුවේ මන්ත්‍රී නිමල් පියතිස්ස කියයි

(නුවරඑළිය සම්පත් ජයලාල්)

ජනතාව පත්ව සිටින පීඩා හේතුවෙන් හෙට අනිද්ද වන විට කිසිදු දේශපාලනඥයකුට පාරට බැසීමට නොහැකි තත්ත්වයක් උදාවනු ඇතැයි නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිමල් පියතිස්ස මහතා අනතුරු අඟවයි.

ජාතික නිදහස් පෙරමුණ නියෝජනය කරමින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් පාර්ලිමේන්තුවට තේරී පත්වූ පියතිස්ස මහතා සහ ගොවි නියෝජිතයන් අතර සාකච්ඡාවක් නුවරඑළියේදී පැවැති අතර, ඒ සාකච්ඡාවෙන් අනතුරුව මාධ්‍ය හමුවක් අමතමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා මෙසේ ද පැවසීය.

අපේම ආණ්ඩුවේ අය ලේබල් ගහනවා, ජේ. වී. පී. එකේ, සමගි ජන බලවේගේ, යූ. එන්. පී. එකේ අය තමයි මේ උද්ඝෝෂණ පිටුපස්සේ ඉන්නේ කියලා. මම ඒක සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. මේ උද්ඝෝෂණ කරන්නේ පොහොට්ටුව බලයට ගේන්න කැපවුණු අයයි. ඒ අය තමයි මේ ආණ්ඩුව ජයග්‍රහණය කෙරෙව්වේ.

ඒක නිසා නැවත කරුණු සලකා බලලා ගොවි ජනතාවගේ ගැටලුව ගැන අපි මීට වඩා සංවේදී වෙන්න ඕනේ. ආණ්ඩු හදන්නෙත්, වට්ටන්නෙත් ගොවියා. රටේ ජනමතයට එරෙහිව මොන වැඩ කළත් වැඩක් නෑ. ඒ වගේ අත්දැකීම් අපිට ඕන තරම් තියෙනවා.

ආණ්ඩුව 69 ලක්ෂයේ ජනමතයට පිටුපාලා යනවා නම් අපිට සිද්ධ වෙනවා, ආණ්ඩුව ගැන හිතනවට වඩා 69 ලක්ෂයේ ජනමතය ගැන හිතන්න. ඒක නිසා අපි ආණ්ඩුවට බල කරනවා තනි තීරණ ගන්නේ නැතුව ජනමතය අනුව කටයුතු කරන්න කියලා යි ද පියතිස්ස මන්ත්‍රීවරයා කියයි.

කාබනික පොහොර යෙදීම ජාතික ප්‍රතිපත්තියක් කරන්නැයි ආණ්ඩුකාරවරු ජනපතිගෙන් ඉල්ලත්

(හාරිස්පත්තුවේ මොහොමඩ් ආසික්)

කෘෂිකර්මාන්තය සඳහා කාබනික පොහොර යොදා ගැනීමේ වැඩසටහන ජාතික ප්‍රතිපත්තියක් බවට පත් කරන ලෙස ආණ්ඩුකාරවරුන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත යෝජනාවක් ඉදිරිපත් කළ බව මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ. ගමගේ මහතා පවසයි.

දීර්ඝ කාලීන වශයෙන් රටට වඩාත් හිතකර මෙම යෝජනාව අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත ඉදිරිපත් කළ ඒ යෝජනාවේ සඳහන් බව ආණ්ඩුකාර ගමගේ මහතා කියයි.

කාබනික පොහොර සම්බන්ධ මෙම යෝජනාව පාර්ලිමේන්තුවේ සම්මත කර අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම කාලෝචිත බව ද ආණ්ඩුකාරවරයා කියයි.

රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කරන බව සඳහන් සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්තිය රාජ්‍ය නිලධාරීන් පරිශීලනය කිරීම ඉතා වැදගත් වී ඇතැයි පෙන්වා දුන් ඒ මහතා ඇතැම් රාජ්‍ය නිලධාරීන් දෙබිඩි පිළිවෙතක් අනුගමනය කිරීම හේතුවෙන් නව වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට බාධා මතුවී ඇතැයි ද කීවේය.

දණහිස් වේදනාවට දීර්ඝ කාලීනව බෙහෙත් ගැනීම වකුගඩු නරක් වීමට හේතුවන බව ඔබ දන්නවාද?
දණහිස් අමාරුවට නිට්ටාවට සුවය.....
PRP ප්‍රතිකාර ක්‍රමය මඟින් කාටිලේජ් නැවත වර්ධනය කර දණහිස් අමාරුව නිට්ටාවට සුව කර ගන්න.
Kandy Central Hospital Pvt (Ltd)
127/3, හොඩපොළ, ගෙලිඕය.
තොරතුරු සඳහා අපට කතා කරන්න. 081 2314 500 / 077 7132 352
CENTRAL

නගර ගැටගැසීම ශල්‍යකර්මයකින් තොරව සුවකරගන්න
ඉතා අඩු වියදමකින්, අඩු වේදනාවකින් සහ අවම කාලයකින් ඕනෑම සංකූලතා සහිත නගර ගැට ගැසීම් තත්වයක් සුව කර ගැනීමට අප වෙත පැමිණෙන්න
තොරතුරු සඳහා
අපට කතා කරන්න 081 2 314 500 / 0777 132 352
CENTRAL

ලූ.ලූ.ලූ...

නරක සභාවේ හිස් පුටුවට දෙළුමක් ලෙවකන්නා කෙළ හළයි



නරක සභාවක දෙන්නෙක් මොණර කොළ ගන්න ගිහින් මාට්ටු වුණාලු. තව එක් කෙනෙක් ළඟ ඉඳලා දුවලා බේරුණාලු. ඒ වුණාට එයාට අපවාදෙන් බේරෙන්න බැරි වුණාලු. එද ඉඳලා එයාගේ පුටුව හිස්ලු. දැන් ඒ පුටුවට කට්ටිය ඉව අල්ලනවලු. ඒ ජනතාව එපා කියලා පරද්දපු අයලු.

මේ පුටුවේ කෙනෙක් ඉන්දවන්න පුළුවන් දෙළුමක් වගේ රතු කෙනාටලු. පුටුවට ඉව අල්ලන අය දැන් දෙළුම අතගානවලු. අනේ මට දෙන්න අනේ මට දෙන්න කියනවලු. කලින් පුටුවේ රහ දන්න කෙනෙක් දැන් නරක සභාවේ ගේට්ටුව ළඟටම කිට්ටු කරලලු. මම කලින් හිටපු නිසා ඕක ලැබෙන්න ඕන මට කියලා එයා කියනවලු. මම තමයි එන්නේ කියලා සභාවේ අයටත් පොර ටෝක් දෙනවලු.

මෙයාගේ පැටිකිරිය එච්චර හොඳ නැලු. හිටිය කාලේ කරපු ඒවා කට්ටිය දන්නවලු. අපෝ එයා නම් එවන්න එපා කියලා කට්ටියක් දෙළුමක් වගේ රතු කෙනාට කිව්වලු. එයාව මිනිස්සු තේරුවේ නැත්තෙත් හිටපු කාලේ කරපු දේවල් දන්න නිසාලු. ඒ වුණාට දෙළුමක් වගේ රතු එක්කෙනා එවන්න ලෑස්ති මෙයාවමලු. පුටුවට කෙළ ගිලින කෙනා ලාලා කියලා සිංදුවකුත් කියාගෙන නරක සභාව පැත්තේ කැරකෙනවලු. ආසාව වැඩිකමට එයාගේ කට පල්ලෙන් කෙළත් බේරෙනවලු.

රට ලොකු විපතක බවට නිලමෙලා අතර සාකච්ඡා



වැස්ස වැඩියිලු. පොහොර නැලු. ගුරු උද්ඝෝෂණ දරුණුයිලු. ගෑස් පෝලිම් එමටලු. සල්ලි දීලත් සිමෙන්ති ගන්න බැලු. මේ තරම් ප්‍රශ්න කන්දරාවක් කවදවත් තිබ්බේ නැලු. මේ ඇයි කියලා ලොකු හෝටලයක කට්ටියක් කතා වුණාලු. නිළමේ ඇඳුම් අඳින දෙතුන් දෙනෙකුත් එතන හිටියලු.

පනස් නමයේ අලි කුලප්පුව මතකද කියලා කෙනෙක් ඇහුවලු. දන්න බව අඟවලා හැමෝම ඔළු හෙළෙව්වලු. මොකද වුණේ අගමැති මැරුණා නේද කියලා කිව්වලු. ඒක මොකටද මෙතන්ට කියලා එක්කෙනෙක් ඇහුවලු. මේ පාර පෙරහරේ අලි කුලප්පුව අමතකද කියලා ඇහුවේ ලොකු දේවාලෙක නිළමේ කෙනෙක්ලු. අලි කුලප්පු වුණත් මේ වගේ පෙරහර කැඩිලා තියෙනවාද කියලා තව එක්කෙනෙක් සිහිපත් කළාලු.

රටට ලොකු විපත් වෙන බව මේවා වෙනකොටම මම දැනගත්තා කියලා කිව්වේ මහ දැනුමක් ඇති නිළමේ කෙනෙක්ලු. මෙතන හිටිය කෙනෙක් පැත්තකට ගිහින් කෝල් එකක් අරන් ජනතා මනාපයෙන් ආපු කැබිනට්ටුවේ කෙනකුට මේක කිව්වලු. මේ වෙන දේවල් දැක්කම ලොකු ශාපයක් කියලා අපිටත් හිතෙනවා කියලා එයා කිව්වේ ගොත ගහමින්ලු. කොරෝනා අස්සේ මේවා කරනකොට අපි මේවා බලාපොරොත්තු වුණා කියලා තව කෙනෙක් කිව්වේ ඇනුම් පදයකට වගේලු.

මන්ත්‍රීවරුන්ගේ විරෝධයෙන් කළු වින්ඩ්ස්ක්‍රීන් ගැලවෙයි

බර්ට්‍රෝල් බ්‍රෙෂ්ට්ගේ කතාවක චරිතයක් ගැන කතාවක් ඇති වුණාලු. ඒක කළේ ගුරු භවතෙක්ලු. එයා සිහිපත් කළේ නටාලියා බිසව ගැනලු. එහෙම කෙනෙක් අපේ ළඟත් ඉන්නවා කිව්වලු. අපි නටාලියාලා ඕන තරම් දැකලා තියෙනවා කියලත් කිව්වලු.

සතුරු සේනා මැදුර වට කරලා රජු පරාජය කරත්දී නාටාලියා දරුවා මෙහෙකාරිය ළඟ දලා පැනලා ගියාලු. ඒ ගියේ ඇඳුම් පැලඳුම් විතරක් නෙවෙයි මේකප් බඩුත් අරගෙනලු. එහෙම හිස උදුම්මා ගත් අය අපිට ඕන නෑ කියලා ගුරා කිව්වලු. මේ නටාලියා පහළ සේවකයින්ට පුදුම විදිහට කරදර කරනවාලු. දැන් එයාට ලොකු විරෝධයක්ලු.

යන්නේ කළු කරපු වීදුරු තියෙන රථයකලු. ඒවා කළු කරලා තියෙන්නේ මේ දවස්වල ඔළුව ගිනි අරන් ඉන්න මහත්තයකුගේ ආශිර්වාදයෙන්ලු. මේ වාහනේ පොලිස් මහත්තුරුන්ට පේන්නෙත් නැලු. හිටපු ගමන් මේක පදවන්නේ නතාලියාමලු. වටේ කළු නිසා ඒක බලන්න වෙන්නේ වින්ඩ්ස්ක්‍රීන් එකෙන් විතරයිලු. ගෝරනාඩුවෙන් පස්සේ කළු වීදුරු දැන් සුදු වෙලාලු. අඩන්න ඕන කිරි එරෙන්න කියලා කියන්නේ මේවට තමයි කියලා ආනන්දලා දෙන්නෙක් කතා වුණාලු.

වියතා මිහිදුට ඉඩ දීමෙන් නෝනට ආපහු යන්න වෙලා



පුටුවක ඉන්න මිහිදු පන්නන්න දෙන්නෙක් ෆුල් ට්‍රයි කළාලු. නැති වැරදිත් හොය හොයා ලෙඟඩ දන්න හැදුවලු. එක් කෙඟණක් අලියා පිටෙන් පනින්න ගිහින් කොන්ද කඩා ගත්ත කෙනෙක්ලු. අනිත් කෙනා මහජන මුදලින් නඩත්තු වෙන කෙනෙක්ලු.

මිහිදු පන්නන්න මේ දෙන්නා මෙහෙම එකතු වෙලා වැඩ කරන්නේ ඇයි කියන එක හැමෝටම ප්‍රශ්නයක්ලු. මේක දේශපාලන හිතවත්කමක් නෙවෙයි කියලා නොදන්න කෙනෙක් නැලු. මොකද දෙන්නා පක්ෂ දෙකකලු. කොහොමෙන් හරි එක පාරක් ඒ අයට ඕන විදිහට වැඩේ සිද්ධ වුණාලු. ඒ රැයක් එළි වෙනකල් විතරයිලු. හැරෙන තැපෑලෙන් මිහිදු ආපහු ආවලු. ඒ වියත් මගින් ආපු කෙනාට පින් සිද්ධ වෙන්නලු. පන්නපු එක දවසට බවලතෙක් ඇවිත් ඉඳ ගෙනලු.

විපක්ෂයේ කට්ටිය මිහිදු පුටුවෙන් යවනවට කැමැති නැලු. වියතට වැඩේ කිව්වේ එයාලලු. තමන්ගේ රැහේ උන් කියන එක පැත්තකට දන්න වියතට බැරි වුණාලු. වියතා නිසා මිහිදුට ඉඩ දීලා නෝනට ආපහු යන්න වුණාලු. මේක වාවාගන්න බැරුව අලියා පිටෙන් වැටිලා කොන්ද අත ගගා හිටිය මහත්තයා දන් මිටි කන්න ගත්තලු. මිහිදුට තමන්ගේ කාමරේ දොර කඩාගෙන යන්න වුණේ ඒ නිසාලු. ඒ වෙලාවේ ටී.වී.කාරයෝ සැට් එකක් එතන්ට ඇවිත් ලු. මාධ්‍ය ගෙනල්ලා ෂෝ දන්න එපා කියලා ටයි දපු මහත්තයෙක් මිහිදුට බැන්නේ අත් බනුවෙන්ලු. වැඩේ කළේ මමයි කියලා ලොකු පුටුවකට නගින්න ආසාවෙන් ඉන්න ධර්මෙට බර කෙනෙක් හැම තැනම කිය කිය යනවලු

බකමූණා

තේ වගාවටත් අබ සරණයි

සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ ලේකම් එම්.ඒ. ප්‍රේමරත්න

රජය මැදිහත්විය යුත්තේ වෙළඳ පොළටයි. කොළඹ තේ වෙන්දේසියේදී තමයි වැවිලි සමාගම්වලට ගැනුම්කරුවන් (බයර්ස්ලා) හමුවන්නේ. කොළඹ වෙන්දේසියෙන් තේ ගන්න ගැනුම්කරුවන් 'ලංකාවේ සිලෝන් ටී' කියන සන්නාමය පාවිච්චි කරලා ලෝක වෙළෙඳ පොළට තේ අලෙවි කරනවා. එහිදී වැඩි මිලකට ලංකාවේ තේ අලෙවි කරනවා. ගමේ ගොවීන් කෙහෙල් කැණ විකුණනවා වගේ තමයි මේකත් වෙන්නේ. මේ වෙළෙඳ ක්‍රමය නිසා සෑම නිමි තේ කිලෝ එකකින්ම වැවිලි සමාගම්වලට රුපියල් 200 කට වැඩි මුදලක් මේ වනවිට අහිමි වෙමින් තිබෙනවා." යි සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ ලේකම් එම්.ඒ. ප්‍රේමරත්න මහතා පවසයි.

ලංකාදීප "මැදරට" අතිරේකය සමග වැඩිදුරටත් අදහස් දක්වමින් ප්‍රේමරත්න මහතා මෙසේද කීය.

"වතු හාම්පුතුන්ගේ සම්මේලනය හා වතු වෘත්තීය සමිති 03 ක් අතර 1999 සිට තිබුණේ සාමූහික ගිවිසුමක්. ඒ ගිවිසුම අත්සන් කරන්නේ 1999 නොවැම්බර් මාසයේ. ක්‍රියාත්මක වන්නේ ඒ වසරේ දෙසැම්බර් මාසේ.

> **වතු කම්කරුවා රිසි සේ සූරාගෙන කන්න පාලකයාට ලැබිච්ච නීතිමය ගිවිසුමක් තමයි ඔය සාමූහික ගිවිසුම කියන්නේ. ඒ නිසා මෙය අතිශය අසාධාරණ ගිවිසුමක්. කම්කරුවාට මේ යථාර්ථය තේරුම් කර දෙන්න වතුකරය නියෝජනය කරන ප්‍රබල වෘත්තීය සමිති කියා ගන්නා අය මැදිහත් වෙන්නේ නෑ**

තේ කර්මාන්තය පැත්තෙන් බරපතළ ගැටලු රැසක් තිබෙනවා. ඒ සම්බන්ධව සම්පූර්ණ වගකීම රජයට තිබෙනවා. රජය තමන්ගේ දේපළක් කාට හරි බදු දුන්නාට පසුව ඒ බදු ගත්ත අය හොඳින් කරනවාද? විනාශ කරනවාද? එහි ආදයම කෙසේද? රජයේ පංගුව කොපමණද? බදුකරුගේ පංගුව කොපමණද කියා සැලකිලිමත්ව සිටිය යුතුයි. එය සම්පූර්ණයෙන්ම රජය අතහැර දමා තිබෙනවා. උදහරණයක් ලෙස දැක්වුවහොත්, ගොවියෙක් කෙසෙල් කැණක් එහෙම නැතිනම් වී ටික අරගෙන පොළට ගිහින් විකුණනවා වගේ දෙයකට සමාන වැඩක් තමයි වතුවලටත් වෙලා තියෙන්නේ.

රජය මැදිහත්විය යුත්තේ වෙළෙඳපොළ වෙනුවෙන්. මේ රජය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීගේ තේ ගසේ පාලනයෙන් තවම මිදිලා නෑ. තවම ඒ ගනුදෙනුවේ තමයි ඉන්නේ. එසේ මිදෙන්න අදහසක් තිබෙනවා නම් වරායේ ජැටි ගනුදෙනුව, අයි.ඕ.සී., කෙරවළපිටිය විදුලි බලාගාරය වගේ ජාතික සම්පත් ඒ විදිහට විකුණන්නේ නෑ. ඒ ප්‍රතිපත්තිම තමයි තේ වෙළෙඳ පොළටත් අද බලපාලා තියෙන්නේ. ආණ්ඩුව තේ වෙළෙඳ පොළ කළමනාකරණය කරන්න හරියට මැදිහත් වෙනවා නම් දැන් තියෙන ඩොලර් අර්බුදයටත් විසඳුමක් එනවා. රුපියල් 200 ක් කියන්නේ ඩොලරයකට ආසන්න මුදලක්. රජයේ භාණ්ඩාගාරයට ලැබෙන්න තියෙන ඒක පිටට යනවා. එතනින් වැවිලි සමාගම්වලට එන ආදයමේ අඩුවක් වෙනවා. වැවිලි සමාගම්ද මේ දෙය හරියට කළමනාකරණය කරන්නේ නැතිව ස්වභාවිකව යන ක්‍රමයට යමින්, ගෙනියමින් ඔවුන්ද කටයුතු කරමින් සිටිනවා. මේ දෙය පදනම් කර ගනිමින් තමයි වැටුප් ප්‍රශ්නය ඇතුළු ගැටලු මතුවෙලා එන්නේ.

වැටුප් ප්‍රශ්නයේදී මේ වනවිට වැවිලි සමාගම් අර්බුදයකට ගිහින් තියෙනවා. නමුත් ඒ අර්බුදය අභියෝගයක් ලෙස භාර ගනිමින් විසඳනවා වෙනුවට ඔවුන් භාර ගන්න එක පැත්තක තියලා පහළම ඉන්න කණ්ඩායම වන වතු කම්කරුවා මත සියලුම දේ පටවනවා. ඒක බරපතළ ප්‍රශ්නයක්. හැම කෙනෙක්ම තමන්ගේ පංගුව බේරාගෙන සියලු බර කර්මාන්තයට වැඩි දයකත්වයක් ලබා දෙන වතු කම්කරුවා මත පැටවීම අසාධාරණයි. උදහරණයක් ලෙස ගත්තොත් වැවිලි සමාගම් දැන් කියනවානේ ආණ්ඩුව රසායනික පොහොර බෙහෙත් තහනම් කරපු නිසා ඒ අයට යෙදවුම් කර ගන්න බැරි වුණා කියල. දැන් අපේ නිෂ්පාදන වියදම වැඩි වෙලා. කර්මාන්තය පවත්වාගෙන යන්න බැරිවෙලා තිබෙන නිසා කම්කරුවන්ට නියමිත වැඩ දින ගණන දෙන්න බැරි වෙලා තිබෙන බව සමාගම් කියනවා. ඉදිරියටත් මේ තත්ත්වය පැවතුණහොත් වතු සමාගම් සතියට දින 03 කට වැඩ දින ගණන සීමා කරන බව කියනවා. කම්කරුවා මේ තත්ත්වයත් එක්ක වැටුප් නොමැතිව ඉතා අසරණ වෙනවා. ඔවුන් කබලෙන් ලිපට වැටෙනවා පමණක් නොවෙයි අළු වෙලාම යනවා.

> **දැන් තිබෙන තේ වගාව කාබනික පොහොරවලට ගැලපෙන විදිහට හදාගෙන නෑ. තේ ගහ කියන්නේ නිතිපතාම කොළේ, දලු අයින්වෙන වගාවක්. පසට කාබනික ද්‍රව්‍යයක් තමයි එකතු වෙන්න ඕන. වෙනත් දේවල් කළාට වැඩක් නෑ. කාබනික පොහොර රඳවා ගන්න කාබනික පසක් තිබිය යුතුයි. විද්‍යාත්මක ක්‍රමයක් මේ අය ළඟ නෑ. මෙම පොහොර ප්‍රශ්නය නිසා තේ දලු නිෂ්පාදනය 30% ක් 40% කින් පහළ බසිනවා. ඒකත් ප්‍රබල විදිහට කම්කරුවාට බලපානවා**

ශ්‍රී ලංකාවේ සිටින කෘෂිකර්ම විද්‍යාව සම්බන්ධ ඉහළම බුද්ධිමතුන් සම්බන්ධ කරගෙන ඒ අයගේ සහාය ලබා ගැනීමට මේ අවස්ථාවේ රජය සෘජුවම මැදිහත්විය යුතුයි. විෂයට අදළව රටේ විශාල ප්‍රාඥයින් පිරිසක් ඉන්නවා. නමුත් අවාසනාව ඒ අය කිසි කෙනෙක් මේ කාර්යට සම්බන්ධ කර ගන්නේ නෑ. පොහොර නිෂ්පාදනය කරන සමාගමුයි, වතු අධිකාරිවරුයි තමයි මේ සම්බන්ධව සියලු තීන්දු තීරණ ගන්නේ. තේ සඳහා පරේක්ෂණායතන කීපයක් ලංකාවේ තිබෙනවා. නමුත් ඒ ආයතන තේ කර්මාන්තය සඳහා යොදවා ගන්නේ නෑ. මේ නිසා කර්මාන්තයට බරපතළ වැරැද්දක් සිදුව තිබෙනවා. මේ සියල්ලේ ප්‍රතිඵලය කම්කරුවා පිට පැටවෙනවා.

වතු කම්කරුවා රිසි සේ සූරාගෙන කන්න පාලකයාට ලැබිච්ච නීතිමය ගිවිසුමක් තමයි ඔය සාමූහික ගිවිසුම කියන්නේ. ඒ නිසා මෙය අතිශය අසාධාරණ ගිවිසුමක්. කම්කරුවාට මේ යථාර්ථය තේරුම් කර දෙන්න වතුකරය නියෝජනය කරන ප්‍රබල වෘත්තීය සමිති කියා ගන්නා අය මැදිහත් වෙන්නේ නෑ. කොලේ වහලා රැකගෙන ඉන්නවා. මේක බරපතළ අසාධාරණ ගිවිසුමක්. උදහරණයක් ලෙස කිව්වොත් ඔය ගිවිසුමේ සඳහන් වෙනවා වැඩ ඉලක්ක සම්පූර්ණ කිරීම ගැන. එය පාලකයින් හා වතු කමිටු අතර අවබෝධයෙන් සාද ගන්න ලෙසයි කියල තියෙන්නේ. වතුවල තිබෙන ක්‍රමය අනුව කවදවත් සේවකයට ගිහින් වතු හාම්පුතුන් සමග එක මේසයක ඉඳන් සාකච්ඡා කරන්න මානසිකත්වයක්, වටපිටාවක් හැදිලා නෑ. වතු කම්කරුවාට සාකච්ඡා කියන දෙයක් පුරුදු කරලා නෑ. ඒ අයට පුරුදු කරලා තියෙන්නේ හාම්පුතා විසින් බලහත්කාරයෙන් පටවපු දෙයක්. එක්කෝ වැඩ කරන්න ඕන නැතිනම් ගැටුම් ඇති කරගන්න ඕන. දෙපාර්ශ්වය අතරේ තියන සාකච්ඡා නෑ. වතු පාලකයින් විසින් ගන්නා ඒකමතික තීරණ අනුව කම්කරුවා වැඩ කළ යුතුයි.

> **ඉදිරියටත් මේ තත්ත්වය පැවතුණහොත් වතු සමාගම් වැඩ දින ගණන දින 3 කට සීමා කරන බව කියනවා. කම්කරුවා මේ තත්ත්වයත් එක්ක වැටුප් නොමැතිව ඉතා අසරණ වෙනවා. ඔවුන් කබලෙන් ලිපට වැටෙනවා පමණක් නොවෙයි අළු වෙලාම යනවා**

පසුගිය කාලයේ වතු කම්කරුවාගේ වැටුප් වැඩි කිරීමේදී රුපියල් 500 තිබුණ වෙලාවේ 700 කරද්දි නෙළිය යුතු අමු තේ දලු ප්‍රමාණය කිලෝ 02 කින් වැඩි කළා. 700 න් 900 කරද්දී නැවත කිලෝ 02 ක් වැඩි කරනවා. ඊළඟ සැරේ පඩිය කීයක් හරි වැඩි කරද්දී තව කිලෝ 02 ක් වැඩි කරනවා. මිනිස්සු කොහොමද දලු හොයන්නේ? තේ වගාව අලුත් කරන්නේ නැතිනම්, සංවර්ධනය කරන්නේ නැතිනම්, රසායනික පොහොර පමණක් විසඳුම නොවෙයි. කාබනික පොහොර හා රසායනික පොහොර දෙකේම මිශ්‍රණයක් තමයි තේ වගාවට තිබිය යුත්තේ. දැන් තිබෙන තේ වගාව කාබනික පොහොරවලට ගැලපෙන විදිහට හදගෙන නෑ. තේ ගහ කියන්නේ නිතිපතාම කොළේ, දලු අයින්වෙන වගාවක්. පසට කාබනික ද්‍රව්‍යයක් තමයි එකතු වෙන්න ඕන. වෙනත් දේවල් කළාට වැඩක් නෑ. කාබනික පොහොර රඳවා ගන්න කාබනික පසක් තිබිය යුතුයි. විද්‍යාත්මක ක්‍රමයක් මේ අය ළඟ නෑ. මෙම පොහොර ප්‍රශ්නය නිසා තේ දලු නිෂ්පාදනයෙන් 30% ක් 40% ක් පහළ බසිනවා. ඒකත් ප්‍රබල විදිහට කම්කරුවාට බලපානවා.

වතු කම්කරුවාගේ වැටුප් ප්‍රශ්නයේදී මැතිවරණ පොරොන්දු සමග ආණ්ඩුවට බැරිවුණා මග ඇරලා ඉන්න. ආණ්ඩුව විසඳුමක් විදිහට පඩි පාලක සභාව හරහා වැටුප් වැඩි කළා. දැන් ක්‍රියාත්මක වන ක්‍රමයේදී පඩි පාලක සභාව මගින් දෛනික වැටුප රුපියල් 1000 දෙන්න කැමැති වුණේ කෑළි ක්‍රමය අනුවයි. තරගයට වැඩ කර හම්බ කරන ක්‍රමයට. පඩි පාලක සභාවට කෑළි මිම්මයි කාල මිම්මයි යන ක්‍රම දෙකටම වැටුප් හදන්න පුළුවන්. කාල මිම්ම අනුව රුපියල් 1000ක වැටුප දෙන්න දලු කිලෝ 20 ක් කඩන්න ඕන. ඒක නෙළන දලු කිලෝ එකකට රුපියල් 50 ද 60 ද 70 ද කියන ඕන ගණනකට යන්නත් පුළුවන්. එතෙන්දි රුපියල් 1000ට වැඩිය දෙන්නත් පුළුවන්.

උදේ පාන්දර පහට වැඩට ආවොත් සවස අඳුර වැටෙනකන් ඉන්නත් පුළුවන්. කිලෝ එකකට ගිවිස ගත්ත මුදල අනුව නෙළන ලද දලු කිලෝ ගණනට වැටුප ගෙවනවා. මේක තමයි වැටුප් ප්‍රශ්නයේදී සාකච්ඡා කළේ. නමුත් ඒ ක්‍රමයට වෘත්තීය සමිති එකඟ වුණෙත් නෑ. පාලකයන් එකඟ වුණෙත් නෑ. වෘත්තීය සමිති එකඟ වුණේ නැත්තේ කම්කරුවා හූරාගෙන කන තවත් ක්‍රමයක් නිසයි. ආණ්ඩුව එකඟ වුණේ නැත්තේ ඒ වෙලාවේ මැතිවරණ පොරොන්දු සම්බන්ධව මෙය පාරා වළල්ලක් වෙලා තිබුණ නිසයි. පසුව පඩි පාලක සභාවම වෙනත් යෝජනාවකට ගියා. රුපියල් 900 ක මූලික වැටුපක් සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයින්ගේ අරමුදල් ද සහිතව. 2005 අයවැයෙන් එකතු කරපු රුපියල් 40 යි. 2016 අයවැයෙන් රුපියල් 60 යි එකතු කරලා රුපියල් 100 ට හැදුවා. මූලික වැටුප වන රුපියල් 900 යි අයවැයෙන් සහන දීමනා ලෙස වැඩිකළ 100 ත් එකතු කරලා තමයි රුපියල් 1000 ක වැටුප හැදුවේ. සාමූහික ගිවිසුමේ කොන්දේසියක් කඩකරමින් වෘත්තීය සමිති පඩි වැඩි කරගන්න කටයුතු කළා. හාම්පුතුන්ගේ සංගමය අභියෝග කරන්නේ මෙන්න මේ ක්‍රමය සම්බන්ධවයි.

වැවිලි සමාගම් වතු කම්කරුවන්ට සාධාරණ වැටුප් වැඩි කිරීමක් නොකළ නිසා සමාජයේ සියලු දෙනා අතර පොදු මතයක් හැදුනා වැටුප් වැඩි කළ යුතුයි කියලා. රජය වතු වෘත්තීය සමග එක්ව පඩි පාලක සභාව හරහා රුපියල් 1000 ක වැටුප් වැඩි කිරීමක් කළා. පසුව වැවිලි සමාගම් විසින් ඒ තීරණයට අභියෝග කරමින් අධිකරණ ක්‍රියාමාර්ගවලට ගොස් තිබෙනවා.

අපේ අපනයන ආදයමෙන් 2019 වනවිට 15% ක් ආවරණය කළේ වැවිලි කර්මාන්තයෙන්. දැන් මේකත් අහිමි කරමින් යන්නේ. ලංකාවේ වැවිලි කර්මාන්තය හරහා සෘජුව හා වක්‍රව ජීවත් වූ ලක්ෂ 20 කට ආසන්න පිරිස දැන් එන්න එන්නම කුඩා වෙමින් යනවා. අපි කියන්නේ මේ කර්මාන්තය සංවර්ධනය කළ යුතුයි කියලයි. එය කරන්නත් පුළුවන්. හොඳ කළමනාකරණයක් අවශ්‍යයි. රජය හා වතු හාම්පුතුන් මෙහි ශ්‍රමිකයාට තෘප්තිමත් සේවාවක් දිය යුතුයි. වතු කම්කරුවාගේ පහසුකම් සපුරා දිය යුතුයි. එසේ නොවුණහොත් වටිනා තේ කර්මාන්තය අභාවයට යෑම වළක්වන්න බෑ."



සටහන හා ඡායාරූපය:
මස්කෙළිය - ගාමිණී බණ්ඩාර
ඉලංගන්තිලක

කොරෝනාවෙන් ඇම්බැක්කේ කැටයම්කරුවොත් හාන්සියි

පවුල් 35කට එදාවේලවත් හොයාගන්න හයියක් නෑ

සමහරු කැටයම් වැඩ නවත්තලා කුලී වැඩ කරන්න පෙළැඹිලා

කර්මාන්තයට රජයෙන් කිසිම අනුග්‍රහයක් ලැබෙන්නේ නෑ

ඇම්බැක්ක යැයි කී විට අපගේ සිහියට එන්නේ ලී කැටයමය. ඒ තරමට ඇම්බැක්ක හා ලී කැටයම් ශිල්පය බැඳී තිබේ. අනුරාධපුර, පොළොන්නරු යුගවල ශෛලමය නිර්මාණ කෙරෙහි මුල් තැන දී තිබිණි. එහෙත් ගම්පොළ හා මහනුවර රාජධානි සමයේදී බොහෝ කලා නිර්මාණ සිදුකර තිබෙන්නේ දැව භාවිතයෙනි. මේවා අතරින් පෞරාණික වටිනාකමින් යුත් ඉතා වැදගත් හා නිර්මාණාත්මක දැව නිර්මාණ දක්නට ලැබෙන්නේ ඇම්බැක්ක කතරගම දේවාලයේය. මෙම ලී කැටයම් ලෝක ප්‍රසිද්ධ වී තිබෙන්නේ ඒවාහි ඇති සියුම් බව හා නිර්මාණශීලී ගුණ නිසාය. ලොව හොඳම ලී කැටයම් දැකිය හැකි ස්ථානයක් ලෙස ඇම්බැක්ක කතරගම දේවාලය යුනෙස්කෝ සංවිධානය ද ප්‍රකාශයට පත්කර තිබේ.

ඇම්බැක්ක දේවාලය කෙරෙහි පවතින දෙස් විදෙස් ආකර්ෂණය නිසාම එම ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් පාරම්පරික කැටයම් නිර්මාණ ශිල්පීන් ව්‍යාපාර ආරම්භ කළහ. දේවාලයේ කැටයම් නිර්මාණ සියැසින් දැක ගැනීමට එන බොහෝ දෙනා ප්‍රදේශයේ කැටයම් නිර්මාණ ශිල්පීන්ගේ නිර්මාණයක් දෙකක් මුදල් දී රැගෙන යන්නේ ගමනේ සිහිවටනයක් ලෙස තබා ගන්නවාටත් වඩා ඒවා ඉස්තරම් නිර්මාණ වන නිසාය. කොවිඩ් එන්නට පෙර කැටයම් නිර්මාණ විකුණා ජීවිතය සරිකර ගත් මෙම පිරිස අද පත්ව සිටින්නේ ඉතා අසීරු අඩියකටය. වසර දෙකක් තිස්සේ සංචාරකයින් නොපැමිණීම නිසා දේවාලය අවට ඇති නිර්මාණ අලෙවි කඩ අත්හැර බොහෝ දෙනකු නිවෙස්වලට වී සිටිති. මේ නිසා අද එම කඩ දිරාපත් වෙමින් තිබේ.

කැටයම් කර්මාන්තයෙන් ජීවත්වන පවුල් 35 ක් පමණ ඇම්බැක්ක, රංගම, වේරවෙල ප්‍රදේශවල ජීවත් වෙති. දෙස් විදෙස් සංචාරකයින් නොපැමිණීම නිසා අද ඔවුන් ලී කැටයම් නිර්මාණ කිරීම නවත්වා එදාවේල සොයා ගැනීම සඳහා කුමක් හෝ කුලියක් කරන්නට පෙළඹී සිටිති.

ජනාධිපති සම්මානලාභී කැටයම් ශිල්පියකු වන සතිෂ් කුමාර මහතා අද ඇම්බැක්ක ආශ්‍රිත කැටයම් ශිල්පීන් පත්ව සිටින තත්ත්වය මෙසේ විස්තර කළේය.

"මම 2016 වසරේදී මධ්‍යම පළාතේ තරුණ කැටයම් ශිල්පියා ලෙස සම්මාන ගත්තා. ඒ අවුරුද්දේ පළාතේ විවෘත අංශයේ දැව කැටයම් අංශයේ තෙවන ස්ථානය දිනා ගත්තා. ජනාධිපති සම්මාන දිවයිනේ තෙවන ස්ථානය මට හිමි වුණා. පළාතේ තරුණ දැව කැටයම් ශිල්පියා ලෙස 2017 තේරී පත් වුණා. මධ්‍යම පළාතේ විවෘත දැව කැටයම් අංශයේ ප්‍රථම ස්ථානය දිනා ගත්තා. දිවයිනේ දෙවන ස්ථානයට හිමි ජනාධිපති සම්මානය 2019 දී ලැබුණා. ඒ අවුරුද්දේ මධ්‍යම පළාතේ විශිෂ්ටතම දැව කැටයම් ශිල්පියා බවට පත්වුණා. මේ වගේ සම්මාන ගේ පිරෙන්න තිබෙනවා. සම්මාන විතරයි අපට ලැබෙන්නේ. මේ කර්මාන්තයට නිසි රාජ්‍ය අනුග්‍රහක් ලැබෙන්නේ නැහැ. යම් යම් අවස්ථාවල යන්ත්‍ර සහ උපකරණ ලබා දී තිබෙනවා. නමුත් මේ කොවිඩ් එක්ක මේ ප්‍රදේශයේ ජනතාවගේ ජීවිත උඩු යටිකුරු වුණා. මුහුණුපොත ඔස්සේ හිත මිතුරන් ලබා දෙන ප්‍රසිද්ධිය නිසා මම නිර්මාණ කොහොම හරි අලෙවි කර ගන්නවා. මේ පාරම්පරික ශිල්පය රැක ගන්නත් නිර්මාණකරුවන්ට හොඳ වෙළෙඳ පොළකුත් ලබා දෙන්න රජයේ අවධානය යොමු විය යුතුයි. එහෙම වුණොත් රටට විදේශ විනිමය විශාල ලෙස උපයා ගන්න පුළුවන් වගේම ඇම්බැක්ක ආශ්‍රිත කැටයම් ශිල්පීන්ගේද ජීවිත හොඳ තත්ත්වයකට පත් වේවි. අවුරුදු දෙකක් තිස්සේ මේ අයට තමන්ගේ ජීවිකාව කරලා මුදල් උපයන්න අවස්ථාවක් නැහැ. මේ අවුරුදු දෙකටම ඒ අයට දුන්නේ රුපියල් 5000.00 බැගින් දෙවතාවක්. ඒ මුදලින් අවුරුදු දෙකක් ජීවත් වෙන්න පුළුවන්ද කියලා කල්පනා කරලා බලන්න."


ලී කැටයම් කරන සතිෂ්

බණ්ඩාර මැණිකේ

දේවාලය ආසන්නයේ කඩයක් පවත්වා ගෙන ගිය බණ්ඩාර මැණිකේ මහත්මිය මෙසේ කීවාය.

"මගේ මහත්තයා නැති වෙලා අවුරුදු 10 ක් විතර වෙනවා. එදා ඉඳලා අපි ජීවත් වුණේ දේවාලය ළඟ කඩේ කරගෙන. කොරෝනා නිසා කඩේ වහලා. සත පහක ආදායමක් දැන් අවුරුදු දෙකක ඉඳලා නැහැ. මේ නිසා අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නේ. ඉස්සර පාසල් දරුවෝ ට්‍රිප් ආවා. හොඳ ලාභයක් තිබ්බා. අපේ දරුවෝ ඉස්කෝලේ යවලා කාලා බීලා ජීවත් වුණේ මේකෙන්. දැන් අවුරුදු එකහමාරක විතර ඉඳලා ඒක වහලා. අපි නොහිතපු දෙයක් තමයි සිද්ධ වුණේ. සංචාරකයෝ හොඳට ආපු කාලේ දවසට රුපියල් 5000ක් හොයපු අවස්ථාත් තිබෙනවා. දැන් ඉතිං කඩේ වහලා දලා තියෙන්නේ. කොරෝනාවලට රට වහලා තිබුණු වෙලාවේ ආණ්ඩුවෙන් දුන්න රුපියල් 5000 ලැබුණා. දැන් මොනවා කරන්නද කියලා හිතාගන්න බැරුව ඉන්නේ. ආදායම් නැති වුණා කියලා අපේ වියදම් නැති වෙලා නැහැනේ. බඩු මිල දැන් හොඳටම වැඩි වෙලා. එදට වඩා වියදමක් යනවා ජීවත් වෙන්න. මේ ගැන රජය අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලනවා. මොකද අපි කාටවත් බරක් නැතුව ජීවත් වුණු පිරිසක්."

වසා දමා තිබෙන කඩ

සටහන හා ඡායාරූප
සෙංකඩගල
ඉඳුනිල් කහටපිටිය

හඳුනානොගත් මත්ද්‍රව්‍ය ලෝලීන් ඉතාම බහුලයි

මත්ද්‍රව්‍ය නිසා වසරකට 43,000ක් මැරෙනවා

ඉදිරියේදී රසායනිකව හැදූ මත්ද්‍රව්‍ය එන්න පුළුවන්

ජාතික රෝහලේ මානසික සුවතා ඒකකයේ වෛද්‍ය නිලධාරි - කේ.ඩබ්ලිව්.එස්. කල්‍යාණතිස්ස

(කුණ්ඩසාලේ - පී.එම්. රාජපක්ෂ)

මත්ද්‍රව්‍ය නිවාරණයට සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ට ප්‍රතිකාර කිරීම වෙනුවෙන් විවිධ වැඩසටහන් දියත් කළත් සමාජය තුළ හඳුනා නොගත් මත්ද්‍රව්‍ය ලෝලීන් ද සිටින බව ජාතික රෝහලේ මානසික සුවතා ඒකකයේ වෛද්‍ය නිලධාරි කේ. ඩබ්ලිව්.එස්. කල්‍යාණතිස්ස මහතා පවසයි

සමාජයේ සිටින හඳුනානොගත් ඇබ්බැහිවූවන් පිළිබඳව විමසිලිමත් වීම නිලධාරීන් සතු විශේෂ කාර්යය භාරයක් වන බව වෛද්‍ය කල්‍යාණතිස්ස මහතා වැඩිදුරටත් ප්‍රකාශ කරයි.

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවනාගාරයේ දී පසුගියද පැවැති දැනුවත් කිරීමේ වැඩසටහනක දී ඒ මහතා මෙම අදහස් පළ කළේ ය.

එම නිසා මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් හඳුනා ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු බව පැවසූ ඒ මහතා සමාජයේ පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව දැඩි විමසිලිමත් විය යුතු බවත් එහිදී තොරතුරු ලබාගන්නා මූලාශ්‍ර පිළිබඳව වැඩි අවධානය නිරන්තරයෙන් යොමු විය යුතු බවත් පෙන්වා දුන්නේය.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් මහනුවර දිස්ත්‍රික්කයේ මත්ද්‍රව්‍ය නිවාරණ හා පුනරුත්ථාපන ක්‍රියාවලිය වෙනුවෙන් අනුයුක්ත කළ අභ්‍යාසලාභී උපාධිධාරීන් දැනුවත් කිරීම නිමිත්තෙන් මෙම වැඩසටහන පැවැත්විණි.

මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන් වාර්ෂිකව පුද්ගලයන් හතළිස් තුන් දහසක් මරණයට පත් වන බව වර්ෂ 2019 දී දීපව්‍යාප්තව කරන ලද සංගණනයක දී හෙළිවී ඇති බව පැවසූ ඒ මහතා මත්වතුර, ගංජා, හෙරොයින්, අයිස් වැනි සමාජය තුළ දැනට ප්‍රචලිත මත්ද්‍රව්‍යවලට අමතරව රසායනිකව සකස් කරන ලද මත්ද්‍රව්‍ය ව්‍යාප්තවීම ඉදිරියේ දී ලෝක ප්‍රවණතාවයක් බවට පත්වෙමින් පවතින බව ද පැවසීය. එමෙන්ම මාත්‍රාව ඉක්ම වූ ඖෂධ සහ අනිසි ඖෂධ භාවිතය ද බරපතළ මත්ද්‍රව්‍ය සම්බන්ධ ගැටලුවක් බවට පත් වෙමින් පවතින බව ද වෛද්‍යවරයා ප්‍රකාශ කළේය.

කුමන ආකාරයේ මත්ද්‍රව්‍ය භාවිත කළත් ඒ තුළින් සිදුවන සමාජ ව්‍යසනය වැළැක්විය නොහැකි යැයි බව පෙන්වා දුන් වෛද්‍ය කේ. ඩබ්ලිව්.එස්. කල්‍යාණතිස්ස මහතා මත්ද්‍රව්‍ය සඳහා පුද්ගලයන් ආකර්ශනය කර ගැනීම සමාගම් විසින් සෘජු හා වක්‍ර අයුරින් විවිධ ක්‍රියාකාරකම්වල නිරත වන බව ද පැවසීය.

මත්ද්‍රව්‍ය වලින් පුද්ගලයා මුදා ගත හැකි නමුත් සමාජීය ඇබ්බැහිවීම සහ හිතවතුන්ගේ බලකිරීම් මත යළි ඒ වෙනුවෙන් ඔවුන් යොමු වන බව වෛද්‍යවරයා පෙන්වා දුන්නේය.

මහනුවර දිස්ත්‍රික් ලේකම් වන්දන තෙන්නකෝන් මහතා, මහනුවර සහකාර දිස්ත්‍රික් ලේකම් සඳමාලි ජයසිංහ මහත්මිය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මධ්‍යම පළාත් සම්බන්ධීකාරක ටී.ජී. ආරියරත්න මහතා ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

බාල වයස්කාර බිනිබිරිය අපයෝජනය කළ 75 හැවිරිදි සීයාට 15 වසරක බරපතළ වැඩ සහිත සිර දඬුවමක්

(අනුරාධපුර අධිකරණ උපාලි ආනන්ද)

පස් වැනි ශ්‍රේණියේ අධ්‍යාපනය ලබමින් සිටි බාල වයස්කාර තම මිනිබිරියට බරපතළ ලිංගික අපයෝජනයන් කළ බවට මාතලේ මහාධිකරණය හමුවේ අධිචෝදනා ලබා සිටි විත්තිකාර සීයා කෙනකු එකී අධිචෝදනාවට වරදකරු බවට තීන්දු කළ මාතලේ පළාත් බද මහාධිකරණයේ පූර්වගාමී විනිසුරු සහ මධ්‍යම පළාත් බද සිවිල් අභියාචනා මහාධිකරණයේ වත්මන් විනිසුරු ආචාර්ය සුමුදු ප්‍රේමචන්ද්‍ර මහතා ඔහුට වසර 15 ක බරපතළ වැඩ සහිත සිර දඬුවමක් නියම කරයි.

රුපියල් 10,000 ක දඩ මුදලක් ගෙවන ලෙසද නියෝග කළ මහාධිකරණ විනිසුරුවරයා ඒ දඩ මුදල නොගෙවන්නේ නම් විත්තිකරුට තවත් මාස 6 ක ලිහිල් සිර දඬුවමක් ද නියම කළේය. ඊටද අමතරව පැමිණිලිකාර වින්දිත දැරියට මුදලින් රුපියල් 50,000 ක වන්දියක් ගෙවන ලෙසටද නියෝග කළ මහාධිකරණ විනිසුරුවරයා ඒ වන්දි මුදල ගෙවීම පැහැර හරින්නේ නම් විත්තිකරු තවත් වසරක සිර දඬුවමකට ද යටත් කළේය.

මෙසේ දඬුවම් නියම වූයේ දඹුල්ල යාපාගම පදිංචිකරුවකු වන 1ඩ්ඩ්ඩ් හේවගේ නමැති 75 හැවිරිදි වයෝවෘද්ධ පුද්ගලයකුටය.

2007 ජනවාරි 01 ද සිට ඒ වසරේම ජූනි 21 වැනිද දක්වා අතර කාලය තුළ මාතලේ මහාධිකරණ බල ප්‍රදේශයට අයත් දඹුල්ල යාපාගමදී බාල වයස්කාර තම මිනිබිරිය බරපතළ ලෙස අපයෝජනය කළ බවට නීතිපතිවරයා විසින් මෙම විත්තිකරුට එරෙහිව මාතලේ මහාධිකරණය හමුවේ වෙන් වෙන් වශයෙන් අධිචෝදනා පත්‍ර තුනක් ගොනු කරනු ලැබ තිබිණි.

විත්තිකරුට දඬුවම් නියම කරමින් මහාධිකරණ විනිසුරු ආචාර්ය සුමුදු ප්‍රේමචන්ද්‍ර මහතා සඳහන් කළේ විත්තිකරුට එරෙහිව පැමිණිල්ල විසින් නගා ඇති චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිලි පාර්ශ්වය සමත්ව ඇති බවයි.

විත්තිකරු මාස ගණනක් සිය මිනිබිරියට බරපතළ ලෙස ලිංගික අපයෝජන කර ඇති බවත් ඒ හිංසාවන් විද දරා ගැනීමට නොහැකිව දැරිය සිය පාසලේ පංති බාර ගුරුතුමියට මේ බව පවසා ඇති බවත් ඉන් පසුව විත්තිකරු කර ඇති මෙම අපරාධය පිළිබඳව සියලු කරුණු අනාවරණය වූ බවත් අධිකරණ නඩු විභාගයේදී කියැවිණි.

මෙම නඩුවේ ලඝු නොවන මූලික විභාගය දඹුල්ල මහෙස්ත්‍රාත් අධිකරණය හමුවේ පැවැති අතර විත්තිකරුට අධිචෝදනා කියාදීමෙන් පසුව එහි වැඩිදුර විභාගය සඳහා මාතලේ මහාධිකරණයට යොමු කර තිබිණි. දඹුල්ල පොලිසිය සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන මෙහෙවනු ලැබීය.

අපනයන බෝග පැළ තවාන්කරුවන්ට අමුද්‍රව්‍ය සොයාගන්න අමාරුයි

අබාධිත රණවිරු උඩුවාවල කියයි

අපනයන බෝග පැළ තවානක් පවත්වාගෙන යන රණවිරුවකු පසුගියද අපට හමුවිය. කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමට ක්‍රියාන්විතයේ ඉදිරියෙන්ම සටන් වදිද්දී ත්‍රස්ත ප්‍රහාරයකට ලක්ව දෙපාපණ නැති වී ආබාධිතව පැළ තවානක් පවත්වාගෙන යන මොහු මුළු රටටම ආදර්ශයකි.

මාතලේ-පල්ලේපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශයේ මානින්ගමුව, දෙවරම්මුල්ල ගමේ පදිංචි ඔහු යූ. ටී. එච්. ඩී. එස්. කේ. උඩුවාවලය. 1992-01-22 වැනිද ශ්‍රී ලංකා යුද හමුදාවේ ගැමුණු 07 වැනි බලයට බැඳුණු උඩුවාවල මහතා 1996 වසරේදී විවාහ විය. ඔහු දෙදරු පියෙකි. වැඩිමල් දියණිය විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන අතර රළඟ දියණිය 10 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන්නීය.

යුද හමුද ක්‍රෝප්‍රල්වරයකු වූ උඩුවාවල මහතා ක්‍රියාන්විතයේ ඉදිරියෙන්ම සටන් වදිද්දී තාලම්බකුලම් හිදී 2007-05-27 වැනි දින ත්‍රස්තවාදීන්ගේ ස්නයිපර් ප්‍රහාරයකට ලක්ව දෙපා පණ නැතිව ගියේය. වසර හතරක් පමණ ප්‍රතිකාර ලබා සිය නිවසට පැමිණ ඇත්තේ ආබාධිතව රෝද පුටුවෙනි.

ඩී. එම්. චන්ද්‍රා කුමාරි ආබාධිත කෝප්‍රල් උඩුවාවල මහතාගේ බිරිඳය. පරිසරයට හා වගාවට ආදරය කරන උඩුවාවල මහතා ස්වයං රැකියාවක් වශයෙන් අපනයන බෝග පැළ තවානක් ආරම්භ කිරීමට යොමුවිය. ඒ සඳහා සිය බිරිඳ වන චන්ද්‍රා කුමාරි මහත්මිය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මාතලේ සහකාර අධ්‍යක්ෂ කාර්යාලයේ 2012 වසරේදී ලියාපදිංචි කළාය.

ගම්මිරිස් පැළ තවානක් කිරීමෙන් ආරම්භ කළ මෙම පැළ තවාන කුරුඳු, සාදික්කා සහ කහ වැනි අපනයන බෝගවලින් ව්‍යාප්ත වී කෝප්‍රල් උඩුවාවල මහතා හොඳ ව්‍යවසායකයකු බවට පත්වී සිටියි.

කෝප්‍රල් උඩුවාවල මහතා අපනයන බෝග පැල තවාන ගැන මෙසේ පැවැසීය.

ත්‍රස්ත ප්‍රහාරයට ලක්ව දෙපා පණ නැතුව ආබාධිතව නිවසට පැමිණි මට අපනයන පැළ තවානක් දැමීමේ සිහිනයක් තිබුණා. මගේ බිරිඳ පැළ තවාන දැමීමට ශක්තියක් වුණා. ගම්මිරිස් පැළවලින් ආරම්භ කළ මේ පැළ තවානේ කුරුඳු සාදික්කා සහ කහ පැළ තවාන් කර තිබෙනවා. වසරකට පැළ 50,000ක් 60,000ක් පමණ තවාන් කරනවා. පැළ තවානේ ගමේ කාන්තාවන් හා පිරිමි 10 දෙනකු පමණ වැඩ කරනවා කාබනික පොහොර අපි විසින්ම නිපදවා ගෙනයි මේ පැළ තවාන කරගෙන යන්නේ. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මාතලේ සහකාර කොමසාරිස් කාර්යාලයේ සහය ඇතිව කොට්ඨාස භාර අපනයන කෘෂි නිලධාරිනී රත්නායක මහත්මිය මේ පැළ තවාන පවත්වාගෙන යාමට උපදෙස් ලබා දෙනවා.

මෙම පැළ තවාන් පවත්වාගෙන යාමට අමු ද්‍රව්‍ය සපයාගන්න ගැටලු තිබෙනවා. පස් දහයියා ලබා ගැනීමේ ගැටලු තිබෙනවා. පස් ප්‍රවාහනයට බලපත්‍ර ලබාදෙන ලෙස වගකිව යුතු අංශවලින් ඉල්ලා සිටිනවා.

(මාතලේ-ඇම්. ඩබ්. සෝමරත්න)

කාබනික පොහොරින් බගවන්තලාවේ එළවළු ගොවීන්ගේ අස්වනු සරුවෙලා

නිලධාරීන් දුන් උපදෙස් මත වගා කළා

අස්වනු හිතුවටත් වඩා සාර්ථකයි

පණුවන් මර්ධනයටත් යෙදුවේ කාබනික දියර

ගෙඩිගෝවා, බෝංචි, ලීක්ස්, බීට්, මිරිස් වගාවල් හොඳට සරු වුණා

කාබනික වගාවට කඳුකරයේ ගොවීන් උනන්දුවීම ඉතා යහපත් කටයුත්තක්

නෝර්වුඩ් ප්‍රා. සභා සභාපති - කේ.කේ. රවී

වත්මන් රජයේ ප්‍රතිපත්තියක් අනුව ක්‍රියාත්මක වන කාබනික පොහොර වගාව සඳහා කඳුකරයේ තේ වතු ආශ්‍රිත එළවළු ගොවීන්ගේ යොමු වීමේ ප්‍රවණතාවය මේ වනවිට වැඩිවෙමින් පවතින අයුරු බගවන්තලාව ප්‍රදේශයේදී අපට දැක ගන්නට ලැබුණි.

බගවන්තලාව, කිලානි තේ වතුයායේ ගොවි බිම්වල එළවළු ගොවීන් කෘෂිකර්ම පරේක්ෂණ සහකාර නිලධාරිවරයාගේ නිසි උපදෙස් අනුගමනය කරමින් තම කාබනික එළවළු වගා කටයුතු ඉතා සාර්ථකව සිදු කරන බව එම ගොවි ජනතාව අප සමග පැවසූහ.

බගවන්තලාව, කිලානි වතුයායේ අබ්දුල් අජීස් මහතා තමන් කාබනික පොහොර පමණක් යොදවා වගා කර ඇති අස්වැන්න නෙළීමට ආසන්න සාර්ථක ගෙඩි ගෝවා වගාව ගැන මෙසේ පැවසීය.

"රජයේ ප්‍රතිපත්තියක් විදිහට ප්‍රකාශයට පත් කර තිබෙන කාබනික වගාව සඳහා මම යොමු වුණා. කෘෂිකර්ම උපදේශක මහත්වරුන්ගේ උපදෙස් ඇතිව මම ගෙඩි ගෝවා වගාවක් කළා. රසායනික පොහොර හා දියර වර්ග කිසිම දෙයක් මගේ වගාවට යෙදුවේ නෑ. දැනට පළදව අඩුයි. නමුත් අපි කාබනික පොහොර යොදලා වගා කරන්න කැමතියි. පණුවන් මර්දනයට අපිට කාබනික දියර හඳුන්වා දෙන බව කීවා. රසායනික වගාව හා කාබනික වගාව අතර විශාල වෙනසක් නෑ. මේ පස කාබනික පොහොරවලට හුරු වුණාට පස්සේ මම හිතනවා අවුරුද්දක් විතර යනකොට අපිට හොඳ අස්වැන්නක් ගන්න පුළුවන් වෙයි කියලා."

බගවන්තලාව, භාරතිපුර පදිංචි ගොවියකු වන ආර්. සෙල්වරාජ් මහතා තම කාබනික වගාව ගැන අප සමග මෙසේ පැවසීය.

"මම ගව පාලනයත් කරනවා. මගේ වගාවන්වලට ගොම පොහොර විතරයි දන්නේ. කොම්පෝස්ට් පොහොර මම සාද ගන්නවා. රසායනික පොහොර හා බෙහෙත් නැතිව මම මේ වනවිට බෝංචි, ලීක්ස්, බීට් හා මිරිස් වගාවන් කරනවා. රසායනික පොහොර නෑ කියල ලොකු වෙනසක් නෑ. කාබනික දියර හා පොහොර කෘෂි උපදේශක මහතාගේ උපදෙස් අනුව පාවිච්චි කරනවා. මම හිතනවා ඉදිරියට වගාව හොඳ වෙයි කියලා."

අප සමග බගවන්තලාව ප්‍රදේශයේ කාබනික වගා ගොවි බිම්වලට නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ සභාපති කේ.කේ. රවි මහතා ද පැමිණ සිටියේය. රවි මහතා අප සමග මෙසේ පැවසීය.

"කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැමිණ බගවන්තලාව ප්‍රදේශයේ ගොවි ජනතාවට කාබනික වගාව සම්බන්ධව විද්‍යානුකූලව උපදෙස් ලබා දෙමින් රජයේ ප්‍රතිපත්තිය අනුව කාබනික වගාවට යොමු කර තිබෙනවා. එය ඉතා හොඳයි. වස විස නැති ආහාර ජනතාවට ලබා දෙන්න කාබනික වගාවට යා යුතුයි. රසායනික පොහොර හා බෙහෙත් යොද වගා කරන එළවළු නිසා මේ පළාතේ විශාල පිරිසක් රෝගී වෙලා තිබෙනවා. උපදින ළමයින් පවා රෝගීන් බවට පත් වෙලා. රෝහල්වලට හා රසායනික පොහොරට වියදම් කරන විශාල මුදල් ඉතිරි කරගෙන ජනතාවට සෞඛ්‍ය සම්පන්න ආහාර ලබා දෙන්න කාබනික වගාවට වතුකරයේ ගොවි ජනතාව යොමු කිරීම ඉතා වැදගත්."

බගවන්තලාව තරුණ සේවා නිලධාරි ආර්. කණකරාජ් මහතා කාබනික වගාව ගැන මෙසේ පැවසීය.

"මම බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිව සිටින්නේ. රැකියාවට අමතරව නිවාඩු දිනවල කාබනික වගා කටයුතුවල නිරත වෙනවා. වැඩිපුරම මම කරන්නේ එළවළු පැළ තවාන් කර ඒ පැළ ප්‍රදේශයේ ගොවි ජනතාවට විකිණීම. ඒ සඳහා කාබනික පොහොර හා දියර පාවිච්චි කරනවා. කෘෂිකර්ම පරේක්ෂණ නිෂ්පාදන සහකාර නිලධාරි සරත් මහතාගේ උපදෙස් අනුව කොම්පෝස්ට් පොහොර හා නිවෙසේ ඉවතලන අපද්‍රව්‍ය යොදගෙන කාබනික දියර, විටමින් හා පණු බෙහෙත් සාදගෙන වගා කටයුතු සාර්ථකව කරගෙන යනවා. මේ වනවිට ප්‍රදේශයේ විශාල ගොවීන් පිරිසක් කාබනික වගාවට යොමුව සිටිනවා."

අත්දැකීම් විස්තර කරන ගොවියෙක්

බගවන්තලාව වසම පාලනය කරනු ලබන්නේ, විදුලිපුර ගොවිජන සේවා මධ්‍යස්ථානය යටතේය. බගවන්තලාව වසම භාර කෘෂිකර්ම පරේක්ෂණ නිෂ්පාදන සහකාර නිලධාරි යූ.ආර්. සරත් මහතා අප සමග අදහස් දක්වමින් මෙසේ පැවසීය.

"මම අඹගමුව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් 06 ක වැඩ ආවරණය කරනවා. එම වසම්වල ගොවි ජනතාව 780 ක් පමණ සිටිනවා. මහා පරිමාණ වාණිජ වගාවකට යන විට මටත් මුලින්ම ගැටලුවක් තිබුණා කාබනික වගාව සාර්ථක වෙයිද නැද්ද කියල. මම මේ වනවිට මගේ වසම්වල ගොවීන් 350 කට ආසන්න පිරිසකට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය හා කාබනික වගාව පිළිබඳව විද්‍යාත්මක දැනුම සමග අදළ පුහුණුව ලබා දී තිබෙනවා. මේ පළාතේ කාබනික වගාවේ අස්වැන්නේ ලොකු වෙනසක් නෑ. අපි පරීක්ෂා කළ ගෙඩි ගෝවා වගාවේ එක ගෙඩියක් කිලෝ 02 කට වැඩියෙන් තිබුණා. එය හොඳ අස්වැන්නක්. කාබනික අස්වැන්න සඳහා හොඳ වෙළඳපොළක් තිබෙනවා. කාබනික පොහොර හා බෙහෙත් යොද කරන වගාවන් වැඩි මිලට මිලදී ගැනීමට පාරිභෝගික ජනතාවගේ වැඩි උනන්දුවක් තිබෙනවා. මගේ ඉදිරි ඉලක්කය උපරිම වශයෙන් ගොවි ජනතාව මෙම ක්‍රමයට යොමු කර වස විසෙන් තොර එළවළු නිෂ්පාදනය සඳහා ජාතික මට්ටමෙන් දයක කර ගැනීමයි."

මෙම අවස්ථාවට බගවන්තලාව පශු වෛද්‍ය නිලධාරිණී නිරෝධ්‍යා වික්‍රමනායක, බගවන්තලාව පොලිසියේ පොලිස් පරීක්ෂක ඩබ්.ඒ.ඩී.සී. වික්‍රමාරච්චි, අඹගමුව ප්‍රාදේශීය සභාවේ නිටපු සභාපති ලෝගනාදන් යන මහත්ම මහත්මිහු හා ගොවීන් පිරිසක් සහභාගි වූහ.

කෘෂි නිලධාරි, තරුණ සේවා නිලධාරි සහ ප්‍රාදේශීය සභාවේ සභාපති කතා කරන අයුරු

සටහන හා ඡායාරූප
මස්කෙළිය
ගාමිණී බණ්ඩාර
ඉලංගන්තිලක

ගොවිතැන වැනසීමේ දැඟලිල්ල

අද ගොවීන්ට යන එන මං නැති වෙලයි තියෙන්නේ. අපි හිතුවා මේ ආණ්ඩුව ආවම හොඳ කලක් යයි කියලා. අර පාකිස්තානයේ වගේ ඉම්රාන් ඛාන් කෙනෙක් බිහිවෙයි කියලයි ඡන්දය දුන්නේ. ඒ වෙනුවෙන් ඡන්දෙට වැඩ කළා. ඡන්දෙන් පස්සෙත් බස් හෝල්ට් පාට කළා. බැම්වල චිත්‍ර ඇන්ද. අන්තිමට ආයෙත් ගසා කාන්ලම තමයි බලයට පත්වෙලා ඉන්නේ කියලා තේරෙනකොට අපි විනාශයට ගිහිල්ලා ඉවරයි මහත්තයෝ.....

නුවරඑළිය, මීපිලිමානේ දී අපට හමුවූ සරත් කරුණාතිලක ඒ අදහස් පළ කළේ දැඩි කෝපයෙනි. උඩරට ගොවීන් විශාල පිරිසක් මේ වනවිට වගාවෙන් ඉවත්වී සිටින අතර, තවත් කොටසක් ඉතා අසීරුවෙන් සිදුකරන ලද වගාවන් සඳහා අවශ්‍ය පොහොර හා පලිබෝධනාශක නොමැතිව ලතවෙමින් සිටියි.

විශේෂයෙන්ම පොහොර හිඟය සම්බන්ධයෙන් සමාජය තුළ විශාල කතා බහක් ඇති වුවත්, පලිබෝධනාශක හිඟය තවමත් දැඩි මාතෘකාවක් බවට පත්ව නොමැත. එහෙත් එය ගොවීන් අතර දැඩි ගැටලුවක් ලෙස පවතින බැව් අපට පසක් වූයෙන් ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම කාලෝචිත බව වැටහුණි. ඒ සඳහා අප ගොවි ගම්මානවල කළ සංචාරයේදී හමු වූ සරත් කරුණාතිලක, නැවතත් තම හඬ අවදි කළේ මේ අයුරිනි.

කහ ඩයි කවලම් කරපු පාන්පිටි, දිලීරනාශක හැටියට වෙළඳ පොළේ විකුණනවා. ගොවින් සල්ලි දීලා ඒවා අරන් ගහලා තවත් අමාරුවේ වැටෙනවා

නුවරඑළියට දැන් දවස් හතරක්, පහක් තිස්සේ වගාබිම් යට වෙන්නම වැස්සා. ඒ වැස්සත් එක්ක වගාවට ලෙඩ රෝග බෝවෙනවා. ඒවා නවත්වන්න නම් දිලීරනාශක තියෙන්නම ඕනේ. නමුත් අද වෙළෙඳ පොළේ දිලීරනාශක නෑ. මහ පරිමාණ වෙළෙන්දෝ ඒවා හංගලා වැඩි මිලට විකුණනවා. එද රුපියල් 850 ට ගත්ත දිලීර නාශක පැකට් එකක් අද ගන්න වෙන්නේ රුපියල් 3000 කට. එහෙම ගත්තා වුණත් නිසි ප්‍රමිතියකින් යුතු ඒවා හම්බ වෙන්නේ නෑ. ඊට අමතරව අනෙකුත් පලිබෝධනාශකත් වෙළඳපොළේ නෑ.

මම අක්කර එකහමාරක දපු කැරට් සම්පූර්ණයෙන්ම විනාශ වුණා ගොළුබෙල්ලෝ කාලා. මේ අය කියන විදිහට අක්කර එකහමාරක ගොළුබෙල්ලෝ අතින් එකතුකරන්න බෑ. ඒ අතර විවිධ ව්‍යාජ පලිබෝධනාශකත් වෙළෙඳ පොළට ඇවිල්ලා. කහ ඩයි කවලම් කරපු පාන්පිටි, දිලීරනාශක හැටියට වෙළෙඳ පොළේ විකුණනවා. ඒ වගේ ගොළුබෙලි නාශක පවා තියෙනවා. ගොවින් සල්ලි දීලා ඒවා අරන් ගහලා තවත් අමාරුවේ වැටෙනවා. ඒවා අහන්න බලන්න එකෙක් වත් නෑ. ලෝකේ තියෙන ලොකුම කැබිනට් එකලු අපිට තියෙන්නේ. ඒ වුණාට ඇමැතියා අද කියන එක නෙමෙයි හෙට කියන්නේ. හාල් ඇටයක්වත් රටින් ගේන්නේ නෑ කිව්ව එවුන්, දැන් හාල් නැව් ගණනින් රටට එනකොට කලිසමකුත් ඇදගෙන පාරේ යනවා. ලැජ්ජ නැති මුන්ට මොනා කිව්වත් වැඩක් තියෙනව ද මහත්තයෝ....

මේ සංචාරයේදී අපට හමුවූ නීල් හෙට්ටිආරච්චි ද තම ගැටලු ඉදිරිපත් කළේ මේ ආකාරයෙනි.

මම අවුරුදු 45 ක් ගොවිතැන් කළේ රසායනික බෙහෙත් පොහොර පාච්චිච් කරලයි. මේ ආණ්ඩුව ඇවිත් ඒවා තහනම් කළාට

හාල් ඇටයක්වත් රටින් ගේන්නේ නෑ කිව්ව එවුන්, දැන් හාල් නැව් ගණනින් රටට එනකොට කලිසමකුත් ඇදගෙන පාරේ යනවා. ලැජ්ජ නැති මුන්ට මොනා කිව්වත් වැඩක් තියෙනව ද

පස්සේ ගොවිතැන් කරගන්න බැරි තත්ත්වයක් උදවෙලයි තියෙන්නේ. අපේ දෙමාපියෝ ගොවිතැන් කළේ ඉතාම සුළු ප්‍රමාණයයි. ඒ අය ගොවිබිමේ ඉන්න පණුවෝ, ගොළුබෙල්ලෝ ඇහිදලා විසික් කළා. කුඩුස්සෝ වගේ සත්තු ඒකාලේ හිටියේ නෑ. නමුත් අද තත්ත්වය වෙනස්. අපි විශාල බිම් වගා කරනවා. ඒ වගා පලිබෝධනාශක නැතුව කරන්න බෑ.

මම පහුගිය කාලේ අක්කරයක විතර බීට් රූට් දැම්මා. පැළ මතුවේගෙන එනකොට බාගයක් ගොළුබෙල්ලෝ කාලා විනාශ වුණා. බේරගත්ත ටිකට ගහන්න පණු බෙහෙත් නැති නිසා තවත් කොටසක් පණුවෝ කාලා විනාශ වුණා. නුවරඑළියේ තියෙන වැස්සත් එක්ක රෝගකාරක පැලේට එනවා. ඒකට දිලිරනාශක ගහන්න ඕනේ. නමුත් ඒවා නැති නිසා ගහන්න බැරිවුණා. අන්තිමට බීට්රූට් වගාවෙන් කිසිම අදයමක් ගන්න බැරිවුණා. දැන් මේ ගොල්ලෝ කියනවා රසායනික පොහොර, බෙහෙත් ගහන නිසා වකුගඩු රෝගීන් වැඩි වෙනවා කියලා. අපි අහනවා මෙච්චර පොහොර බෙහෙත් ගහන නුවරඑළියේ, වකුගඩු රෝගීන් කී දෙනෙක් හම්බ වෙලා ඉන්නව ද කියලා.

රජයේ බලධාරීන් කියනවා රසායනික පොහොර ඉල්ලන අයට ඒවත් එක්ක වකුගඩුත් යවන්න ඕනිලු. මේ අය පහුගිය කාලයේ ගෙන්නපු විෂ පොල්තෙල් එක්ක වකුගඩු කීයක් ගෙන්නුව ද දන්නේ නෑ. මහ පරිමාණයෙන් ගෙන්වන දුම්වැටි, මත්පැන් එක්ක වකුගඩු කීයක් ගෙන්වලා බෙදහරිනවද දන්නේ නෑ. තමන්ගේ බැරිකමට, නොදන්නාකමට, උද්දච්ඡකමට වෙන වෙන කතා කියන එකේ තේරුමක් නෑ. මේ වකුගඩු රෝගය හැදෙන්නේ වතුරේ තියෙන කිවුල් ගතිය නිසයි. ඒකට පිළියම් යොදන්නේ නැතුව වෙන වෙන වැඩ කරලා හරියන්නේ නෑ. අද වෙළෙඳපොළේ වැඩි මිලට පලිබෝධනාශක විකුණනවා. ඒවා බලන්න කෘෂිකර්ම ඇමැතිත් නෑ. පාරිභෝගික අධිකාරියත් නෑ. මිල පාලන අධිකාරියක් නෑ. අපිට අද තියෙන වැඩි දියුණු කරපු දෙමුහුන් බීජ මේ පලිබෝධනාශක පොහොර, නැතුව වගා කරන්න බෑ. ඒක හරියට රේස් දුවන දෙමුහුන් අශ්වයකුට පිදුරු දීලා රේස් දුවන්න කිව්වා වගේ වැඩක් වෙනවා. ඕනෑම දේකට අවශ්‍ය නිසි පෝෂණය ලැබෙන්නේ නැත්නම් හරි ඉලක්කයට යන්න බෑ. ඒකවත් නොදන්න පාලකයොයි අද මේ රට පාලනය කරන්නේ.

මෙම ගැටලුව සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගන්නොරුව උද්‍යාන භෝග පරේක්ෂණ හා සංවර්ධන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ සහ පාංශු හා ශාක පෝෂණ විද්‍යාඥ, ආචාර්ය ප්‍රියන්ත වීරසිංහ මහතාගෙන් විමසීමේ දී ඔහු දැක්වූයේ මෙවන් ප්‍රතිචාරයකි.

පසුගියද රජය ගත්ත තීන්දුවත් එක්ක මේ වෙනකොට කිසිම රසායනික පොහොරක් හෝ පලිබෝධනාශකයක් රටට ගෙන්වන්නේ නෑ. දැනට ගොවීන් පාච්චිච් කරන්නේ ඊට කලින් ගෙනාපු රසායනික පොහොර හා පලිබෝධනාශකයි. ලංකාවේ පලිබෝධනාශක කියලා අපි ගොඩක් වෙලාවට හඳුන්වන්නේ කෘමිනාශක කියන අර්ථයෙනුයි. නමුත් ජාත්‍යන්තර අර්ථයෙන් ගත්තොත් පලිබෝධකයන් කියන්නේ, වල්පැලෑටි, කෘමීන් හා රෝග යන තුනටයි. ඒක නිසා පලිබෝධනාශක කියන හැඳින්වීම මේ තුනම පාලනය කරන ද්‍රව්‍යවලට පොදුවේ භාවිත කරන්න පුළුවන්. සාමාන්‍යයෙන් ලංකාවේ මාස් කන්නයේ වර්ෂාව වැඩියි. එළවළු වපසරිය වැඩියි. ඒ කාලේට ගොඩක් අපිට බලපාන ගැටලුව තමයි දිලීර රෝග.

සරත් කරුණාතිලක

නීල් හෙට්ටිආරච්චි

ආචාර්ය ප්‍රියන්ත වීරසිංහ

යල් කන්නයේ වියළි ගතිය වැඩියි. වගා වපසරිය අඩුයි. ඒක නිසා කෘමිහානිය ගොඩක් වැඩියි. කලින් කන්න දිහා අපි සලකා බැලුවොත් වල්නාශක වැඩි ප්‍රමාණයක් භාවිත කළේ වියළි කලාපයේ වී වගාවටයි. කෘමිනාශක හා දිලීරනාශක භාවිතය, වී වගාවේ දී සාපේක්ෂව අඩුයි. දුඹුරු පැළ කීඩැවා නැත්නම් කොළ පාළුව වගේ රෝග ආවොත් තමයි ඒවා භාවිත කරන්නේ. මම හිතන්නේ මාස් කන්නයේ වී වගාවට වල් පැලෑටි වලින් එන බලපෑම හැර දිලීර හා කෘමි හානි වලින් එන ගැටලුව ඒ තරම් බරපතළ නෑ කියලයි. හැබැයි එළවළු වගාව ගත්තම ඊට හාත්පසින්ම වෙනස්. ලංකාවේ වැඩිම කෘමිනාශක හා දිලීරනාශක භාවිත කරන්නේ එළවළු වගාවලටයි. බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ, බණ්ඩාරවෙල, නුවරඑළිය දිස්ත්‍රික්කයේ වගේම මාතලේ දිස්ත්‍රික්කයෙත් එළවළු වගාවට විශේෂ තැනක් තිබී වෙනවා.

එළවළු වගාවට තියෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි වර්ෂාවත් එක්ක එන දිලීර රෝග. ඒ වගේම වියළි කලාපයේ වුණත් බඩ ඉරිඟුවලට දිලීර නාශක වැඩිපුර භාවිත වෙන්නේ නෑ. නමුත් ලූනු වගාවේ දි වැස්සෙන් වෙන හානිය නිසා දිලීරනාශක වැඩියෙන් භාවිත කරන්න සිද්ධ වෙනවා. එහෙම නැති වුණොත් ලූනු වගාව 100% ක්ම විනාශ වෙන්න පුළුවන්. ඒ වගේම උඩරට එළවළු වගාවේ දී අර්තාපල්වලට වැළඳෙන ප්‍රධාන රෝගයක් තමයි පශ්චාත් අංගමාරය. ඒක ලෝකයේ අර්තාපල් වගාවට තියෙන දරුණුම රෝගයයි. මේ වෙනකම් කිසිම රටක් ඒකට කාබනික දිලීර නාශකයක් හොයා ගෙන නෑ. ඒක නිසා අර්තාපල් වවනවා නම් දිලීරනාශක අනිවාර්යයෙන්ම අවශ්‍යයි. එහෙම නැති වුණොත් ගොවියා සම්පූර්ණයෙන්ම අසාර්ථක වෙනවා. වර්ෂා කාලගුණය එක්ක අපිට ඒ වෙනුවට ගොවියට දෙන්න කිසිම විකල්පක් නෑ.

ඒ වගේම උඩරට ප්‍රදේශවල වවන තක්කාලි වගාවටත්, අංගමාරය රෝගය හැදෙනවා. ඒකෙන් 80% ක විතර අස්වනු හා බෝග හානියක් වෙන්න පුළුවන්. ඒ හානිය හඟුරන්කෙත හා මාතලේ දිස්ත්‍රික්කයේ දී සාපේක්ෂව අඩුවීමේ හැකියාවක් තියෙනවා. ඊට අමතරව බෝංචි වගාවේ කරල් පුල්ලි රෝගය නිසා එහි අස්වැන්න සම්පූර්ණයෙන්ම අඩුවෙන්න පුළුවන්. එක මැඬලන්නත් අපිට දිලීරනාශක අවශ්‍ය වෙනවා. අවධානයට ලක්විය යුතු අනිත් ප්‍රධානම කාරණය තමයි එළවළු බීජ නිෂ්පාදනය. මේ තත්ත්වය රටේ බීජ නිෂ්පාදනයට සෘජුවම බලපානවා. බීජ නිෂ්පාදනයේදී අපි බලන්නේ ඉහළ ගුණාත්මයක් තියෙන්න ඕනේ කියලයි. ඒ ගුණාත්මය සඳහා හොඳ පෝෂණයක් අවශ්‍යයි. රෝග හා පලිබෝධ නැති වෙන්න ඕනේ. ඉදිරියේ දී ඒ ගැටලුව ගොවීන්ට විතරක් නෙමෙයි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවටත් බලපායි.

ඒ වගේම වියළි කලාපයේ බටු, බණ්ඩක්කා, කරවිල වගේ බෝග වලටත් කෘමිහානිය වැඩියි. විශේෂයෙන්ම බටු වගාවේදී ගෙඩි හා කරටි විදින පණුවන්ගේ හානිය කෘමිනාශක යොදලත් පාලනය කරගන්න බැරි මට්ටමකයි තියෙන්නේ. ඉතින් කෘමිනාශක නැති වුණොත් ඒ තත්ත්වය තවත් බරපතළ වෙනවා. කරවිලවලට එන පුස් රෝගයටත් විකල්පයක් නෑ. සමස්තයක් හැටියට දිලීරනාශක හා කෘමිනාශක නැතිවීම නිසා අපේ එළවළු නිෂ්පාදනයට ප්‍රමාණාත්මක පැත්තෙන් වගේම ගුණාත්මක පැත්තෙනුත් බරපතළ හානියක් සිදුවෙනවා. අද පොහාර හිඟය නිසා යම් ප්‍රමාණයක් වගාව අත්ඇරලයි තියෙන්නේ. ඉතුරු ගොවීන්ටත් පලිබෝධනාශක හිඟයට මුහුණ දෙන්න වුණොත් බෝග වලින් 50% කට විතර අස්වනු හා බෝග හානියක් වෙන්න පුළුවන්.

මේ අවස්ථාවේ ගොඩක් දෙනෙක් පොහොර ගැටලුව ගැන කතා කළත් පලිබෝධනාශක ගැටලුවක් ගැන කතා කරන්නේ නැනේ. ඒහෙම කතා නොකරන්නේ වල්නාශක, කෘමිනාශක හා දිලීරනාශක විවිධ නීති විරෝධී ක්‍රම වලින් අපේ රටට ඇවිත් තියෙන නිසයි. විශේෂයෙන්ම ඉන්දියාවෙන්. අද සමාජයේ ඉතා රහසිගතව කළු කඩයක් නිර්මාණය වෙලා තියෙනවා. හොර රහසේ වෙළෙන්දෝ මේවා අලෙවි කරනවා. මේ හුගක් ඒවා දැනට අවුරුදු 15 කට 20 කට කලින් ලංකාවේ තහනම් කරපුවා. ඒවා විස සහිතයි. අද ගොවීන් ඒවා භාවිත කරනවා. ඒ නිසා හරිත කෘෂිකර්මාන්තයක් වෙනුවෙන් යන ගමනට අපි ගත්ත ක්‍රියාමාර්ග වලින්ම තවත් බරපතළ ව්‍යසනයන් නිර්මාණය වීමේ තත්ත්වයක් තියෙනවා. ඒ වගේම මෑතක දී දැනගන්නට ලැබුණා මිනිස් රෝග වලදී භාවිත කරන ප්‍රතිජීවක ඖෂධ වර්ගත් ගොවීන් වගාවට යොදනවා කියලා. ඒක හරි භයානක තත්ත්වයක්. විකල්ප නැති නිසා ගොවීන් එවැනි දේට පෙළඹිලා ඉන්නවා.

මේකට විකල්ප වශයෙන් සමහරු යෝජනා කරන කාබනික පලිබෝධනාශක අපිට ප්‍රධාන කොටස් තුනකට බෙදගන්න පුළුවන්. ප්‍රධාන වශයෙන් ශාක නිස්සාරක. කොහොඹ කොළ, කුරුඳු කොළ, සුදු ලුණු, අනෝද ඇට, මිරිස් කරල් වගේ දේවල් මිශ්‍ර කරලා ඒවා හදනවා. ඊට අමතරව ජෛව පලිබෝධනාශක තියෙනවා. ඒකට අපි භාවිත කරන්නේ ක්ෂුද්‍ර ජීවීන්. දිලීර හෝ බැක්ටීරියා වෙන්න පුළුවන්. ඒ වගේම ජෛව පලිබෝධනාශක වලින් නිස්සාරණය කර ගන්නා වර්ගත් තියෙනවා. අපි සාමාන්‍යයෙන් කෘමිනාශක හෝ දිලීරනාශක වගාවට යොදන අවස්ථා දෙකක් දක්වන්න පුළුවන්. එකක් තමයි වගාවට රෝගයක් හෝ කෘමි හානියක් වෙන්න කලින් පූර්ව ආරක්ෂාවක් හැටියට භාවිත කරන එක. අනිත් එක තමයි එවැනි රෝගයක් හෝ කෘමිහානියක් වුණාට පස්සේ ඒක පාලනය කරන්න යොදන එක. මේ දෙකටම රසායනික ද්‍රව්‍ය තියෙනවා.

කාබනික නිෂ්පාදන නමින් කෙරෙන පලිබෝධනාශක සඳහා මොන වගේ දේවල් භාවිත කරනව ද කියලා අපි දන්නේ නෑ. මේ තුළ වස විසෙන් තොර කෘෂිකර්මාන්තයට යන ගමන ඊට වඩා හාත්පසින්ම වෙනස් අන්තයකට ගමන් කිරීමේ හැකියාව පවතිනවා.

නමුත් කාබනික පලිබෝධනාශකවලට පුළුවන් වෙන්නේ පූර්ව ආරක්ෂාවක් දෙන්න මිසක් රෝගයක් හෝ හානියක් වුණාම පාලනය කරන්න නෙමෙයි. කොහොඹ නිස්සාරකයට වුණත් කෘමීන් පාලනය කරන්න පුළුවන් වෙන්නේ යම් සීමාවකට විතරයි. ඒ වගේම කාබනික කෘෂිකර්මාන්තයට දුම්කොළ නැටි සාරයත් යොද ගන්නවා. ඒවාගේ තියෙන්නේ නිකොටින් කියන විෂ ද්‍රව්‍යයයි. ඒවා හිතකර ජීවීන්ට විශාල ලෙස හානි කරනවා. ඒ නිසාම මීට වසර ගණනාවකට කලින් ලංකාවේ නිකොටින් අඩංගු පලිබෝධනාශක තහනම් කරනු ලැබුවා. නමුත් අපි අද වෙනත් තත්ත්වයක් යටතේ ආයෙත් නිකොටින් අඩංගු ද්‍රව්‍ය භාවිත කරන්න පෙළඹිලා තියෙනවා. අනික තමයි කලවැල්. අපේ වැදි ජනයා මාළු ඇල්ලුවේ කලවැල් යොද ගෙනයි. ඒවා ජලජ ජීවීන්ට ඉතාම අහිතකරයි. එහි ඇති රසායනිකය සහිත පලිබෝධනාශක දැනට වසර ගණනාවකට පෙර අපි තහනම් කෙරුවා. නමුත් කාබනික කෘෂිකර්මාන්තය තුළ නැවතත් එවැනි විස රසායන අපේ භාවිතයට එන්න පුළුවන්. ඒ වගේම අද කාබනික නිෂ්පාදන නමින් කෙරෙන පලිබෝධනාශක සඳහා මොන වගේ දේවල් භාවිත කරනව ද කියලා අපි දන්නේ නෑ. මේ තුළ වස විසෙන් තොර කෘෂිකර්මාන්තයට යන ගමන ඊට වඩා හාත්පසින්ම වෙනස් අන්තයකට ගමන් කිරීමේ හැකියාව පවතිනවා.

අනෙක් අතින් අපි ඉතිහාසයේ පලිබෝධනාශක නැති කෘෂිකර්මාන්තයක නියැලුණා කියලා කියනවා. ඒක අතීතයේ තිබුණු ජීවන රටාවත් එක්ක විය හැකි දෙයක්. උදහරණයක් විදිහට හේනක් ගත්තොත්, විශාල කැලෑවක් කපලා, ගිනි තියලා වගා කරනවා. ඒ කැලයේ පරිසර පද්ධතිය 100% විනාශ කරලා අලුත් පරිසර පද්ධතියක් තමයි අපි එතැන ස්ථාපිත කරන්නේ. ඒ අලුත් පරිසරය තුළ, එතන තිබුණු කිසිදු ගහක් කොළක් නෑ. හේන ගිනි තැබීමත් එක්ක පසේ හිටපු ජීවීන් හා අවකාශයේ හිටපු ජීවීන් සියල්ල විනාශ වෙලා ගිහින්. ඇත්තටම ජීවානුහරණයකුයි සිද්ධ වෙලා තියෙන්නේ. අපි එතන සිටුවන්නේ ඒ පරිසරයට පරිබාහිරම බෝග. ඒවට හානි කරන පලිබෝධයන් කිසිවෙක් එතන නෑ. ඉතින් අවුරුදු දෙක තුනක් කිසිදු

අර්තාපල්වලට වැළඳෙන ප්‍රධාන රෝගයක් තමයි පශ්චාත් අංගමාරය. ඒක ලෝකයේ අර්තාපල් වගාවට තියෙන දරුණුම රෝගයයි. මේ වෙනකම් කිසිම රටක් ඒකට කාබනික දිලීර නාශකයක් හොයා ගෙන නෑ. ඒක නිසා අර්තාපල් වවනවා නම් දිලීරනාශක අනිවාර්යයෙන්ම අවශ්‍යයි

උපද්‍රවයකින් තොරව හේන කරගෙන යන්න පුළුවන්.

අනිත් එක තමයි එද අපි හිටෙච්චේ ස්වභාවික පරිසරය එක්ක අනුගත වුණු ප්‍රභේද. ඒවාගේ අස්වැන්න අඩුයි. ගුණාත්මක බව අඩුයි. ඒ කියන්නේ රස නෑ. රළු ගතිය වැඩියි. දිරවීමේ අපහසුතා වගේ ගැටලු තියෙනවා. ඒ වගේම ඒ ප්‍රභේදවලට රෝග හා පලිබෝධවලට ඔරොත්තු දීමේ හැකියාව තියෙනවා. හැබැයි අපි පසුකාලීනව ආහාර අවශ්‍යතාව සපුර ගන්න වැඩි දියුණු කළ ප්‍රභේද හඳුන්වා දුන්නා. ඒවායේ අස්වැන්න හා ගුණාත්මක භාවය වැඩියි. හැබැයි රෝග හා පලිබෝධවලට ඔරොත්තු දීමේ හැකියාව අඩුයි. ඕනෑම භෝගයක වැඩි අස්වැන්න හා වැඩි ගුණාත්මයත්, රෝග හා පලිබෝධවලට ඔරොත්තු දීමේ හැකියාවත්, තියෙන්නේ අන්ත දෙකක. ඒ දෙක එක තැනකට ගන්න බෑ. ඒ නිසා එකක් තෝර ගන්න කොට අනෙක මඟ හැරෙනවා. ඒක නිසයි අපි විකල්පවලට යන්නේ. ඒත් අපි පුළුවන් තරම් පලිබෝධවලට ඔරොත්තු දීමේ ගුණය මේ වර්ගවලට එකතු කරනවා.

කෙසේ වුවත් මේ සඳහා විසඳුම් ලෙස මා ඉදිරිපත් කරන්නේ ලෝකයේ පවතින අඩු විෂ පලිබෝධනාශක ලංකාවට හඳුන්වා දිය යුතු බවයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මේ ක්‍රියාවලියේ තමයි ඇත්තටම යෙදිලා හිටියේ. ඒ වගේම ගොවීන් සමඟ මනා සම්බන්ධතාවයක් ගොඩනගා ගෙන ඔවුන්ට නිවැරදි තාක්ෂණය හඳුන්වා දිමත් කළ යුතු වෙනවා. නීති විරෝධීව රටට ඇතුල් වෙන කෘෂිරසායන වැළැක්වීම සඳහා ඇති වැඩපිළිවෙල තවත් තීව්‍ර කළ යුතු සේම කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය වෙන උපදෙස් කෘෂි ක්ෂේත්‍රයේ විද්‍යාඥයන්ගෙන් ලබා ගැනීමත් ඉතාම වැදගත්. ශ්‍රී ලංකාව මුළුමනින්ම කාබනික කෘෂිකර්මාන්තයට යොමු කිරීමට නම් ඒ සඳහා දිගුකාලීන වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයි. ඒ වගේම ලෝකයේ කිසිම රටක් මුළුමනින්ම කාබනික නිෂ්පාදන වලින්, තම ආහාර අවශ්‍යතාවය සම්පූර්ණ කරගෙන නොමැති බව සිහිතබා ගැනීමත් ඉතාම වැදගත් කරුණක් ලෙසයි මම දකින්නේ.

වෙළෙඳ පොළේ වැඩි මිලට පලිබෝධනාශක විකුණනවා. ඒවා බලන්න කෘෂිකර්ම ඇමැතිත් නෑ. පාරිභෝගික අධිකාරියත් නෑ. මිල පාලන අධිකාරියක් නෑ. අපිට අද තියෙන වැඩි දියුණු කරපු දෙමුහුන් බීජ මේ පලිබෝධනාශක පොහොර, නැතුව වගා කරන්න බෑ

සටහන හා ඡායාරූප:
නුවරඑළිය - සම්පත් ජයලාල්

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරන ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 නොවැම්බර් මස 14 වැනිදා ඉරිදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී